**වර්ෂ 2022 සැප්තැම්බර් 09 වන දින පෙ.ව. 09. 30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මුලසුන ගැනීම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.30 වන විට සණ පූර්ණය නොමැති හෙයින් විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 09.45 දක්වා කල්තැබීමට ගරු සභාපතිතුමා විසින් යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රංජන් ප්‍රදීප් මහතා විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු.අ | තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|---|
| 1. | ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.15 |
| 2. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 08.25 |
| 3. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 08.25 |
| 4. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 08.26 |
| 5. | ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බණ්ඩාර මිය | පෙ.ව. 08.30 |
| 6. | ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ | පෙ.ව. 09.00 |
| 7. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 09.05 |
| 8. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.26 |
| 9. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 09.27 |
| 10. | ගරුප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | චන්දිම යුරේශ් පතිරණ මයා | පෙ.ව. 09.30 |
| 11. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා | පෙ.ව. 09.30 |
| 12. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 09.37 |
| 13. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | දීප්ති චන්දන මහතා | පෙ.ව. 09.38 |
| 14. | ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 09.39 |
| 15. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 09.40 |
| 16. | ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 09.45 |
| 17. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.එම්. ජයරත්න මහතා | පෙ.ව. 09.45 |
| 18. | ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 09.45 |
| 19. | ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | එස්.ඩබ්.රන්ජිත් මෙන්ඩිස් මහතා | පෙ.ව. 09.55 |
| 20. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 09.56 |
| 21. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 10.00 |
| 22. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 10.05 |
| 23. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරණ මහතා | පෙ.ව. 10.05 |
| 24. | ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | රොෂාන් දේශප්‍රිය මහතා | පෙ.ව. 10.06 |
| 25. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයා කස්තූරි මිය | පෙ.ව. 10.15 |
| 26. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | ජී.ර්.ඒ.රනිල් එදිරිසිංහ මහතා | පෙ.ව. 10.17 |
| 27. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | බී.ආර්.ඒ.එම්.එස්.සෝමරත්න මිය | පෙ.ව. 10.15 |
| 28. | ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | පෙ.ව. 10.15 |
| 29. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනී පීරිස් මිය | පෙ.ව. 10.20 |
| 30. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදූෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.20 |
| 31. | ගරු ප්‍රාසම | එ.ජා.ප | නයනා ජීවනි අතුකෝරල මිය | පෙ.ව. 10.25 |
| 32. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 10.28 |
| 33. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 10.25 |
| 34. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 12.10 |
| 35. | ගරු ප්‍රාසම | එ.ජා.ප | අයි.කේ.කුලරත්න මහතා | පෙ.ව. 12.15 |
| 36. | ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරඳන මිය | පෙ.ව. 11.48 |
| 37. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.එච්.අසංක එරන්ද මහතා | පෙ.ව. 11.55 |
| 38. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා | පෙ.ව. 11.55 |
| 39. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රවීන් විනෝද් මහතා | පෙ.ව. 11.55 |
| 40. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩී.එම්. ශානක දර්ශන මහතා | පෙ.ව. 11.56 |
| 41. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | බී.ජී.ජීවන් අබේවික්‍රමපාල මහතා | පෙ.ව. 11.57 |
| 42. | ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.රත්නසිරි මහතා | පෙ.ව. 11.20 |

## 01-01 සභා වාර්තාව සභා සම්මත කිරීම.-(2022.08.12 )

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී** එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා **:-**
2022.08.12 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.
**ගරු ප්‍රාදේශීය සභාඋප සභාපති අනිල් ලියනගේ මහතා :-**
2022.08.12 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරිමේ යෝජනාව ස්ථිර කරමි.

**සංශෝධන අංක 1.**
**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

2022.08.12 වන දින මහ සභා වාර්තාවේ යෝජනා අංක 05-20 හි සභා තීරනය ලෙස, **කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් තලාවිටිය පොදු සුසාන භූමියේ ඇති අනතුරුදායක කොස්ගස් 09 හා ගිනිකූරු ගසින් ජන ජීවිතයට ඇති අනතුරුදායක තත්වය ඉවත් කිරිම සඳහා එම ගස් 10 කපා ඉවත්කිරිමට නීත්‍යානුකූල ක්‍රමවේදය අනුව මිල ගනන් කැඳවා කටයුතු කිරීමට අනුමැතිය ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය. ලෙස සඳහන් විය යුතුය.මෙය සංශෝධනය කරන්න.**

**2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**ජරංජන් ප්‍රදීප් මහතා **:-**
අංක 5-3 යටතේ මා විසින් අදහස් දැක්වීමේදි මා ප්‍රකාශ කලේ කිරිඇල්ල පොදු වැසිකිලිය සම්බන්ධයෙන් මම මීට ඉහතදි සම්බන්ධිකරනයේදි කරුනු දැක්වුවා.ඒ කාලේ එහි සභාපති ලෙස හිටියේ කංචන ජයරත්න මැතිතුමා.ලෝක බැංකු ආධාර යටතේ ලක්ෂ 60 ක් මේ වැසිකිලියට වෙන් කලත් ඒ ආධාරය නැවත ආපසු ගියා.ඒකට හේතු වුනේ මේ අනවසර ඉදිකිරීම්. ඒනිසා ඒවා සම්බන්ධව කඩිනමින් කටයුතු කරන්න.

**3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස්** මහතා

5-1 යෝජනාව සම්බන්ධ අදහස් දැක්වීම යටතේ 6 පිටුවේ මා ඇසුවේ ,ගෝනපිටිය ස්පා එකට අවසර අරන්ද? වශයෙනි.

> **Xxxxxxxxxxxxx** 2022.04.08 වන දින මහ සභා වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxx**

**02.**සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන-නැත.
03.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ , පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන.-
04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

## 05.යථා පරිදි කල්දී ඇති යෝජනා :-

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-01.** **මහා සභාවේදී නීත්‍යානුකූලව ගනු ලැබූ තීන්දු තීරණ ක්‍රියාත්මක කල පසු ,ඒවා සම්බන්ධයෙන් ජනතාවට වැරදි අවබෝධයක් ලබාදීමේ අරමුනෙන් කරනු ලබන ද්වේෂ සහගත ප්‍රචාර සම්බන්ධව අප්‍රසාදය පලකිරීමේ යෝජනාව**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මහා සභාවේදී නීත්‍යානුකූලව ගනු ලැබූ තීන්දු තීරණ ක්‍රියාත්මක කල පසු ,ඒවා සම්බන්ධයෙන් ජනතාවට වැරදි අවබෝධයක් ලබාදීමේ අරමුනෙන් කරනු ලබන ද්වේෂ සහගත ප්‍රචාර සම්බන්ධව අප්‍රසාදය පලකිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණි ආනන්ද මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මම මේ යෝජනාව සිදුකලේ ගරු ඩයස් මන්ත්‍රීතුමා විසින් අප සභාවේ දී ගත් යම් තීන්දු සම්බන්ධව එතුමා සමාජ මාධ්‍ය ජාලවල දාලා වැරදි දර්ශනයක්.ජනතාවට වැරදි අවබෝධයක් ලබාදිම අරමුණ.එතුමාට යම් හේතුවක් ඇති. නැත්නම් අපිට වගේම දරුවන්ටත් ලැජ්ජයි.සමාජයට යන්නේ වැරදි මතයක්. ඒක දැනුවත් කරන්නයි. මට ඕනි උනේ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මගේ නම කියවුනා. මේ සභා වාර්තාව පොදු එකක්.අපි ගන්න තීරන සමාජ මාධ්‍ය වල යනවා තමයි.මේ මාධ්‍ය කැඳවලත් තියෙන්නේ සභාවට.මේවා පොදුයි.හැබැයි මිනිස්සු කමෙන්ට් දානවා.මාත් ඇතැම් කමෙන්ට් වලට එකඟ නෑ.නමුත් මේක ප්‍රසිද්ධ ලියවිල්ලක්.එහෙම නෙමේ කියනවා නම් නොදා ඉන්නම්.මීට පස්සේ නොදා ඉන්නම්.මට දුරකථන ඇමතුමකුත් දුන්නා. ( මේ අවස්ථාවේ ගරු මන්ත්‍රීතුමන් විසින් දුරකථන සංවාද පටිගත කිරීමක් ඉදිරිපත් කරන ලදි.)

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මේක පොදු ලියවිල්ලක්.හැමතැනටම යනවා. නමුත් කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේදි වැරදි මතයක් සමාජයට දුන්නේ. වෙනත් ස්ථානවලත් මේ ගැන අසත්‍ය දේ කියලා. සතුටක් ලබනවානම් කමක් නෑ.පසුගිය 17 දා වාහනය දුවන්න බැරි උනා.ඒ නිසා වෙන වාහනයකින් ගියේ රාජකාරි වැඩ වලට.කුලිය නැතිවයි දිව්වේ.ඒ ගිය ගමන් බිමන් ලිඛිතව තියෙනවා.ඒ උනාට ඒක වැරදියට දාලා මුදල් ගත්තා කියලා.පුද්ගලික මම හිතනවා මේගැන සතුටු ඇති ඔබට.ඔබට විශ්වාස විධිහ ඒක නම් මට කමක්නෑ.නමුත් වාහනයක් හිටියාම වෙන වාහනයක යාම සාමාන්‍යයි.පුද්ගලික දෙයක් නෑ. මට දැනුවත් කිරිමට අවශ්‍ය උනේ මේ කටයුත්තේ ඇති නිවැරදි බව, එය වැරදි දෙයක් නොවන බවයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනාව අනුව

**මහා සභාවේදී නීත්‍යානුකූලව ගනු ලැබූ තීන්දු තීරණ ක්‍රියාත්මක කල පසු ,ඒවා සම්බන්ධයෙන් ජනතාවට වැරදි අවබෝධයක් ලබාදීමේ අරමුනෙන් කරනු ලබන ද්වේෂ සහගත ප්‍රචාර සම්බන්ධව අප්‍රසාදය පලකිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

**2022.09.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-02 යටතේ ගනු ලැබූ තීරනයේ උද්‍ධෘතය.**

**05-02 .2016.10.28 දිනැතිව කුරුවිට කුඩා නගර ජල ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන ඇති ජල මෝටරය භාවිතාකරනලද මෝටරයක් බවට දැනගැනීමට ලැබී ඇති හෙයින්, ජල ව්‍යාපෘතියට සිදුවූ පාඩුව හා ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂනයක් ඉල්ලා සිටීම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**2016.10.28 දිනැතිව කුරුවිට කුඩා නගර ජල ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන ඇති ජල මෝටරය භාවිතාකරනලද මෝටරයක් බවට දැනගැනීමට ලැබී ඇති හෙයින්, ජල ව්‍යාපෘතියට සිදුවූ පාඩුව හා ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂනයක් ඉල්ලා සිටීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**පසුගිය සමයේ විශාල ජල හිඟයක් ඇති උනා.පවුල් 50ක් 60 කට විතර ජලය මද කමින් කතා කරලාම බැන්නා.සෝමරත්න මන්ත්‍රීතුමත් අමනාප උනා.මෝටරයක් ගේන්න කිව්වා.එතුමා බය නෑ කිව්වා.කෙසේ හෝ මේ යෝජනාව දැම්මේ පැරනි මෝටරය ගෙනත් මාස 6ක් ගත වෙනකොට කැඩුනු නිසා.සීරියල් නොම්මරය වෙනස්.දහතුන් ලක්ෂ ගානක්.සේවකයෝ භාර අරන් නෑ.ඒ මෝටරයේ තිබිලා අතේ තීන්ත ගැවෙනවා කීවා. ඒ මෝටරය ගෙනාවේ මංගල මන්ත්‍රීතුමා මැදිහත්වෙලා.මුලින් මෝටරය හයි කරන්න එන්න එපා කියලා.ලංකාටෙක් එකට බැරිඋනාම ආයේ සේවකයන්ට එන්න කියලා. මාස 6ක් දුවලා ඒක කැඩුනා.ඒක තාමත් ළිඳේ.ඊට පස්සේ කුලියටත් ලංකා ටෙක් එකෙන්ම මෝටරයක් අරගෙන තියෙනවා. ඒක මේ සේවකයෝ ගොඩ අරන් හදන්න බැලුවත් ඒක හදන්න බැරිවෙලා.පරනයි කියලා තියෙන නිසාත් සීරියල් නොම්මරය වෙනස් නිසාත් ගැටළු තියෙනවා.මට ඕනි ඇයි මෙහෙම උනේ?සී.අයි. ඩී. පරීක්ෂනත් තියෙනවා.මට අනුමැතිය දෙන්න දන්න දේවල් කියන්න.මේ දේවල් දැනගන්න මහජනතාවට අයිතිය තියෙනවා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

**මම කෑ ගැහුවේ ,සද්ද කලේ ජනතාව වෙනුවෙන්.ජනතාව චෝදනා කරනවා.මම නගරයේ මන්ත්‍රී.කුඩානගර ජලය ගන්න බහුතරයක් කුරුවිට ජනතාව.අනෙක් බහුතරය අසංක මන්ත්‍රීතුමාගේ කොට්ඨාසෙ.අපිට තියෙන පීඩනය අනිත් අයට නෑ.පරුෂ වචනයෙන් බනිනකොට තරහා එනවා.මම බය නෑ. ගතවුනු වසර 61 ට මම බයවෙලා නෑ.එදා 88 භීෂනය මැද වුනත් මම පාරේ ගියේ බයේ නෙවේ.මම මේ කියන්නේ මල්කැකුල මහත්මයාට නෙමේ . මේ සභාවේ සභාපතිවරයාට. මේ මානව සම්පත් පදනම නම යෝජනා කලේ මම.එදා ගරු නාලන්ද එල්ලාවල මහතා නිසයි මේ ජල ව්‍යාපෘතිය කුරුවිටට ආවේ.අද මේ 2500 කට ජලය දීලා.ව්‍යාපෘතියට දරාගන්න බෑ.වසරින් වසර මෝටර ගෙන්වන්න වෙනවා.විදුලිය නැත්නම් ඉන්ධන හරි දාලා දුවන්න කීවා.සලිත සභාපතිතුමා, සෙනරත් සභාපතිතුමා,මල්කැකුල සභාපතිතුමා මේ මිනිස් අවශ්‍යතාව සපයන්න විවිධ පහසුකම් ඇති කලා.**

**නමුත් සද්භාවයෙන් මිනිස්සුන්ට දෙන ජලය පහසුකම ඒකක ගනන වැඩි කලත් මේ ධාරිතාවය ව්‍යාපෘතියට දරාගන්න බෑ.අන්තිමට ජලය මිනිස්සුන්ට දෙන්න බැරි තත්වයක් උනා.2016.10.28 මෝටරය ගෙනාවා. සභාව නෑ. මන්ත්‍රිලා නෑ.කොමසාරිස් පාලනයක්.මංගල මන්ත්‍රීතුමත් ඒ ජල කමිටුවේ.අවුරුදු කාලේ ජලය නෑ.මෝටරය වැඩ නෑ. පොම්ප නෑ.පොම්ප**

ක්‍රියාකරු කමිටුවට කිවා.මමත් ජල පාරිභෝගිකයෙක්.ඒ වගේම මේ ජල කමිටුවේ සාමාජිකයෙක්.මේ ජලය නැති උනොත් අපිට කිසිම වෙන ක්‍රමයක් නෑ. ජලය ගන්න.අදටත් එහෙමයි.අදත් ඒ තද අවශ්‍යතාවය නිසා තීන්දු කලා මෝටරයක් ගන්න.තීන්දු කරලා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව මිල ගනන් කැඳවලා නිසි ලෙස විවෘත කරලා වාර්තා අරන් විධිමත්ව ලේකම්ට දුන්නා . පස්සේ අක්‍රමිකතා උනාළු. මාත් කට උත්තර දුන්නා. එදත් මේ කතාව කිවා.චෙක් මුදල් දීම් මම සම්බන්ධ නෑ.මේකේ යම් වැරැද්දක් නම් සීඅයිඩී පරික්ෂන යනවා.වැරදි තියේනම් දඬුවම් ලැබෙයි.ඒ පිලිබඳ කටයුතු කෙරෙනවා. සීඅයිඩී එකෙන් ඉදිරි කටයුතු කරයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

මේ කමිටුවේ දැන් නව පිරිසක් ඉන්නේ.සමිතියකින් පාලනය කලේ . සභාවට ගන්න කීවා. මැදිහත්වෙලා කරන්න කීවා. කොමසාරිස් පාලන කාලේ ජලය නැති උනා.ඒ කාලේ තීරනය උනේ මෝටරයක් ගන්න.මේ කාලේ ජල ව්‍යාපෘතිය ජල මණ්ඩලයට ගන්න කතාවත් තිබුනේ. ඒ නිසා වතුර නැතිකරල හෝ රස්සාවක් අරන් ජල මණ්ඩලයට යන්න උනන්දු උනේ.එදා පන්සලේ සාකච්ඡාවකුත් තිබුනා.එවේලේ හිටපු ලේකම්ගේ උපදෙස් පරිදි මේ කටයුතු කලේ.වැඩත් තහනම් උනා.ගුරුවරයෙක් පෙත්සම ගැහුවේ.පරීක්ෂන යනවා.හොඳයි පරීක්ෂන කරන එක.
මගෙත් තියෙනවා රීති 14 සංශෝධන.මෑතක මිලදීගත් කුඩා නගර ජල සම්පාදන ක්‍රමයට සවිකර ඇති වතුර මෝටරය භාවිතා කිරීමෙන් ප්‍රමානවත් ජලය පොම්ප කිරිමට නොහැකි හෙයින් එය ඵලදායි නොවනබවට තොරතුරු ලැබී ඇති නිසා ඒ පිලිබද පරීක්ෂනයක් සිදු කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා</u>

ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිරයි.දෙල්ගමුව කොට්ටගෙ මගේ ගෙදරටවත් ජලය නෑ.අවු. 1 ක විතර ඉදන්.සභාවේ 45 ටම මේ ගැටළුව නෑ.මේ ගැටළුවට විසඳුමක් අත්‍යාවශ්‍යයි.මේක දැඩි පීඩනයක්.2016 සිට හරියටඅක්‍රමිකතා . ගෝඨාභය මැතිතුමාට යන්න උනේ අඩුපාඩු නිසා.ඒ වගේ මේකෙත් ජලය නැතිවෙනකොටයි අඩුපාඩු කියන්නේ.මමත් ජල පාරිභෝගිකයෙක්.ඒකක 28 මෝටරය ගෙනාවට දැන් ඒක මදි.37 ඕනි.කමිටු රැස්වීම තිබ්බත් තප්පරයට තොරතුරු පිටට ගිහින්.මේ යන්නේ ජල ඔපිස් එකෙන්. මොනා උනත් අවශ්‍යතාවලට අවශ්‍ය නිර්දේශ දෙන්න.අපි ජීවත්ව ඉන්නේ පර්.4ක වගේ ඉඩම්වල. ලිදක් කපන්න කාටවත් බෑ.වතුර බෙදාහරින සීමාවේ කෙනෙක් ඉල්ලුවොත් මේ ජලය දෙනවා.පවුල් 1750කට මේ ව්‍යාපාතිය හැදුවත් දැන් පවුල් 2700 කට දිලා.ඉතින් සමහරුන්ට ජලය යන්නේ නෑ.පිලියමක් ලෙසයි සභාපතිතුමා කට්ටිය එක්ක බෝපත් ඇල්ල උඩින් පුවක්වත්ත ජල යෝජනා ක්‍රමය කරන්න හැදුවේ.විසල් ක්‍රමය ඇවිත් කැන්සල් උනා.මලවට ඒක ආවත් තාම අපිට නෑ.තලාවිටිය පරකඩුව තෙජ්පනාවටත් දෙනවා කීවා.විසල් ජලය දුන්නොත් පාරිභෝගිකයන් 300 ක් විතර අඩුවෙනවා.කොහොම හරි සඳුදාටවත් මේ කනෙක්ෂන් එක දුන්නොත් කුරුවිට නගරයට තියෙන ජල හිඟය අඩුවෙයි.කාලසිමා ගතවෙන්න ,ප්‍රශ්නය උග්‍ර වෙන්න පෙරයි මෝටර් ගෙන්නන්න ඕනි.වැස්සත් මෝටරය යටවෙනවා. ඒක තියන්න ඕනි ලිදෙන් උඩ.ලංකාටෙක් එකෙන් විතරද ගන්නපුළුවන්.ජිනසේන,හේලික්ස්,ඇග්‍රොටෙක් වගේ බැරි ඇයි.අපිට ඕනි වතුර විතරයි. මේ සභාවේ වතුර තමයි අපි ගන්නෙත්.මටත් ඒ ඉන්ධන නැතිකාලේ වතුර තිබුනේ නෑ.ජල ටැංකිය තිබුන තැන අයටත් වතුර නෑ.රන්ඩුවෙලා වැඩක් නෑ. ජනතාව වෙනුවෙනුයි අපි ඉන්නේ.ලක්ෂ 40 ගානක් තියෙනවා.ජල එකේ.මේක ජල මණ්ඩලේ නෙවෙයි.වෙන උපදෙස් මත ජල වතුර පොම්පය ගේන්න. ඇයි 37 ම නොගෙනෙන්නේ?.පඩි ගන්න සේවකයොත් නිසි උපදෙස් දෙන්නෑ.මේ වැඩ හරිම හාස්‍යයට ලක්වෙනවා. හිනාවට ලක්වෙනවා. ඔබතුමා මැදිහත්වෙලා නීත්‍යානුකුලව නිසි පොම්පයක් ගේන්න.ඉතුරු කරලා වැඩක් නෑ.ට්‍රිප් එපා.පූර්න

සහාය දෙනවා. දෙසැම්බර් වෙනකොට මේ උඩ තියන්න හැකි මෝටරයක් ගේන්න.පාසැල, සෞවෙනි කාර්යාලෙටත් වතුර නෑ.මට වේදනාවක්. මිනිස්සු පොඩි භාජනවලට වතුර පුරවලා වැසිකිලිවලට යන්නේ. ඇත්තටම මට වේදනයි.රෙදි හෝදගන්න බෑ.අපි කමිටුවේ හිටියත් අපිට ගෙදර ගිහින් නිදහසේ ඉන්න බෑ.සෝමරත්න මන්ත්‍රීතුමා නීතියට වැඩකරන්නේ.කමිටුවේ. ඒ නිසා මේ ගැටළුව විසඳන්න.පිට්ටනිය වැඩේ වගේ මේකත් විසඳන්න.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

පරික්ෂනයක් සිදු වෙන කටයුත්තක් නිසා මොකුත් කියන්න බෑ.මේ ව්‍යාපෘතිය ත්‍රෛයි පාර්ශවික ගිවිසුමක්.සභාවයි පළාත් සභාවයි පදනමයි.මිනිස්සු කියනවා පදනමට තිබ්බා නම් වතුර තියෙනවා කියලා.වතුර ඕනි.මිනිස්සු දැන් බනිනවා.අපි සභාවේ විතරක් කතා කලාට වැඩක් නෑ.එකඟයි.පුවක්වත්ත යෝජනා ක්‍රමය නැති කලේ ඉහල පෙලේ දේශපාලකයෙක්.ඒ වතුරින් අපිට විශාල කලාපයක් ආවරනය කරන්න තිබුනා.අද විධායක බලය සභාවට.අද ගන්න තීන්දු කර අරින්න දෙන්න එපා.පසුගිය කාලේ ජල මණ්ඩලයටත් දෙන්න ඕනි කියලා කඩා කප්පල් වැඩ කලා.කෙතරම් උත්සහ කලත් බැරිඋනා.උස් බිම් වලට ජලය නෑ.මුදල් ගෙවන්න බිල එනවා විතරයි.ඉතින් ජනතාවට ගැටළු.මේ ව්‍යාපෘතිය හරියට ක්‍රියාත්මක කරන්න.තාක්ෂන දැනුම අරන් අදම තීන්දු ගන්න.සීඅයිඩී නෙමේ මේ ආයතනයෙන්ම මේක විසඳන්න.2016 වරදක් උනා නම් දැන්ද මතක් උනේ?තොරතුරු කවදද ලැබුනේ?මේවාට මිනිස්සු හිනා වෙනවා.2016 ඊලඟ කමිටු රැස්වීමෙදී ඇයි නොතේරුනේ වැරැද්ද?අදවත් මේක දාපු එක හොඳයි.බලධාරීන් ජීවතුන් අතර නෑ.කිරිඇල්ල මඩලත් දේපොල හොරකම් කරලා.මම කියන්නේ කුරුවිට කුඩා නගර ජල යෝජනා ක්‍රමයෙන් සක්‍රියව ජලය අපි දෙමු කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>

මේක සභාවට අයිතිද? අදාල නෑ.මේ සිද්ධිය උනේ පෙර.පසුව කමිටු ගනනක් කරලා.සාරංශ එනවා නම් මෙතරම් වෙලාවක් සභාවට යන්නෑ.නගරේ අයගේ හිතේ අපි කූල් එකේ ඉන්නවා කියලා.මිනිස්සු දන්නෑ. සභාවේ කාර්ය භාරය.මේක භාරදෙන්න හදද්දි මම කිව්වේ පැහැදිලිවම ජලය දීම සභාවේ කාර්ය භාරයක්. අපි කරන්න ඕනි කීවේ මම.ඒක සභාවේ වගකීම.මේ වගේ ප්‍රශ්න වෙලා ඇති.අද වෙන දේ හෙට වෙන්න දෙන්න එපා.කල යුතු දේ කල්දාන්න එපා.ඒකයි මේවගෙන් ඉගෙන ගන්න තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා</u>

උදෙත් පහල මේ සම්බන්ධව කතා උනා.2011 මම පලමුව සභාවට ආවේ .මේ කුඩා නගර ව්‍යාපෘතිය සභාවට ගත්තේ දූෂිත පාලනයක් තියෙන්නේ කියලයි.සෑම අවුරුදු සමයක්ම ලංවෙනකොට මේ මෝටර් කැඩෙනවා.අර්ථය අළුත් අවුරුද්ද ලංවෙනකොට භාවිතය වැඩියි.
හදිසි මිලදි ගැනීම් කරනවා.මට මතකයි. එසේ ජලය අඩු කාලයක් තිබුනා.ජයලත් ඒක භාරව හිටියේ.ඒගැන සොයා බැලුවා.වතුර ඇතට වදින්නෑ.අසංක මන්ත්‍රීතුමාලගේ පැත්තටත් වදින්නෑ. පරික්ෂන කණ්ඩායමක් ගිහින් බැලුවා.රෙදි උන්ඩි කරලා ගහලා.ඒක ගැලෙව්වම වතුර ගියා.මලවට ගියේනෑ.මලව පාලම යට බටයක අඟලක විතර ලීක් එකක්.හරිගස්සන්න ඇස්තමේන්තු හැදුවාම ලක්ෂ 13 ක්.එදා ජල ව්‍යාපාතිය භාරව හිටි අය මේක හැදුවා.ඉතා සුළු වියදමක්.ජල ටැංකිය අඩියට මමත් බැස්සා.යට රොඩු තට්ටුවක් බැදිලා.මේ ව්‍යාපෘතියේ සේවිකාවක් විශාල මුදලක් වංචා කරලා.වැඩ තහනම්.සහභාගි වෙනවට මුදලක් ගෙවන එකම කමිටුව ජල කමිටුව.මේ මෝටරය ගැටළුවක්.විශාල කොමිස් මුදලකට හරි වැඩ කරලද? මම නැතත් මෙතන ඉන්න අය ජන්දෙ ඉල්ලයි ආයේ.හොර ලේබලය නැතිව ජනතාව අතරට යන්න

පුළුවන් වෙන්න ඕනි.අපිට නම් ආත්ම තෘප්තියක් ඇතිව ගෙදර යන්න පුළුවන්. හොර ලේබලය නැතිව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා</u>

විසල් ජලය ක්‍රමවේදය අක්‍රමවත්.පුවක්වත්ත කලා නම් විශාල ප්‍රදේශයකට දෙන්න තිබුනා. ඇහුම්කන් දුන්නෑ.විසල් අද මලවෙන් නතර වෙලා. මිල්ලකඩේ මහපාලම ළඟින් නතරවෙලා. සම්බන්ධිකරනයේ කතා කලත් මොනාවත් වුනේ නෑ.විසල් ජලය අපේ පිලිකන්නට ඇවිත් අපිට නෑ වගේ.අසාධාරනයි.අපිට ජල පෝෂක නෑ.කළු ගඟ විතරයි.විසල් අසාර්ථකයි.ඉබි ගමනේ වැඩ.මම අප්‍රසාදය පල කරනවා මේ විසල් යෝජනා ක්‍රමයේ වැඩ වලට.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා</u>

විසල් ව්‍යාපෘතිය සිදුවේගෙන යන අතරමැදදි වාසු ඇමත්තුමා ආවේ.මාර්තු වලදී දේශපාලන විපර්යාස උනා.වෙනසක් උනා. පුවක්වත්ත යෝජනා ක්‍රමය කරන්නහැදුවත් විරෝධතා ආවා. විසල් අද මලවෙන් නතරවෙලා.ප්‍රබල ලෙස උපාංග නැතිකමත් හේතුවෙලා.අද පාර්ලිමේන්තුවේ කතා වෙලා ජලවිදුලි සබදතා පූර්න ලෙස නතර කරන්න.තව නව සබඳතා අත්හිටුවන්න.තව සංවර්ධන යෝජනා අකර්මන්‍යයි.කුරුවිට වැසිකිලිය කටයුතුත් නතර උනා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්ම ශ්‍රී මහතා</u>

සභාවට ආ කාලේ ඉඳන්ම කතාකල මාතෘකාවක්.අපේ කාලය ඉවරයි.කුඩා නගර ජලයත් නෑ.හැමදාම කියන මාතෘකාව වැසිකිලිය.අපේ ගම්වල ගැටව නැත්ද?අපිටත් තියෙනවා.දැන් කතා කරලා වැඩක් නෑ.ඔබතුමා හැකි ලෙස අපිට සැලකුවා.එරත්නේ තව වැඩ නැතුව නෙවෙයි.අපේ ගම්වල වැඩ තියෙනවා.කුරුවිට විතරක් නෙවෙයි.එදා ඉදන් කියනවා.කම්කරු තණකොල කපනවා. සිග්‍රයෙන් වැවෙනවා.යන්ත්‍රය ගන්න කීවාට උනේ නෑ.ලැට්,ජලය,කොපමන ගැටළුද?ලංකාවේ වැඩිම අප්‍රසන්න වැසිකිලිය.මේක කෙරෙන්නෑ.වැඩිකාලයක් නෑ අපිට.විශාල වියදම් කලා.පලක් නෑ.අපි හිටපු කාලේ අපි ගත්ත දෙයක් නෑ.අපිට ගෙදර ගිහින් සැහැල්ලුවෙන් ඉන්න ඕනි.හොරනාම පටබැදිලා නෑ. ස්වාධිනවඉල්ලුවත් ඡන්ද තියෙනවා.

දැන් මේ වැසිකිලිය හරිනෑ. වතුරවල මඩ.සංචාරක කේන්ද්‍රයක් පේන්නෑ.මේ දෙකවත් කරන්න.සභාවක් ලෙස කතාකරන්න ඉඩ තියන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී නයනා ජීවනි මිය.</u>

වසර 4 ½ ගත උනත් තාම ජල ගැටළුව විසදන්න බැරිඋනා.

නගරයේ වැසිකිලියට හැමෝම බනිනවා. මේ 45 ම ලැජ්ජා වෙන්න ඕනි. ජල පරිභෝජකයන්ට ජරා වතුර එන්නේ.මේ වතුර වල අසූචිත් තියෙනවාළු. කරන්න දෙයක් නෑ.අපිත් ජල පාරිභෝගිකයෝ. උනුකරලා ඒ වතුර ගන්නේ.

මේ ජල ව්‍යාපෘතියේ ගැටළු විසඳලා පිරිසිදු ජලය ජනතාවට දෙන්න.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>

මේ පිලිබඳ අදහස් රැසක් දැක්වුවා.පළාත් පාලන ඇමතිතුමා මේ ව්‍යාපෘතිය වගකිම සභාවට දිම ගැන සතුටුයි.ප්‍රශ්න රැසක් තියෙනවා.එදා ජයරත්න මන්ත්‍රිතුමත් කීවා සභාවට ආදායමක් මෙයින් ගන්න හැකි බව.විසල් ජල යෝජනා ක්‍රමය මලවෙන් නතරවෙලා.ජලය දෙන බව කීවාළු. පවුල් 500 විතර ඉවත් වෙනවා.එතකොට හැකිවෙයි වතුර නිසිලෙස දෙන්න.අපි ජල සම්පත් මණ්ඩලයට කීවා.සුදුසු පොඩි මෝටරයක් ගන්නළු.ලිඛිතව කිවා.අපි අපේ රටේ ආයතනවල බැලුවා.ජිනසේන. අද ලක්ෂ 40 විතර තියෙනවා.ඒ නිසා මෝටරයක් පොම්පයක් ගන්න පුළුවන්.2017.07.10 දින ගෙනා මෝටරය වියදම් අනුව විශාල වියදමක් ගමන් වියදම් ප්‍රවාහනය වගේ දේ වලට දරලා.එදා මෝටරය ගෙනාවේ ඩයස් මන්ත්‍රිතුමා. අධීක්ෂනය සෝමරත්න මන්ත්‍රිතුමා.මාස 6 ක් විතරයි වැඩ කරලා තියෙන්නේ.මුදල් ගෙවලා තියෙන විධිහත් වැරදියි. පිරිසක් රටත් ගියාළු.තව මෝටරයක් ගෙනත්ළු කුලියට .ඒවගේ අක්‍රමික කටයුතු රැසක්.

**අපිටත් මඩ වදිනකොට හිතට අමාරුයි.මංගල මන්ත්‍රීතුමා මාත් එක්ක ආදා ඉදන් අමනාපයි.නමුත් මේ තනතුරු ගන්න ඔය විධිමට බෑ.ජනතා නියෝජිතයින් ලෙස ඒ හැසිරිම ලැජ්ජයි.මේ සියළු අවශ්‍ය කරුණු මම අවශ්‍යතැන් වලට දෙනවා.ඒ නිසා සියළු දෙනාට ස්තුතියි.අදහස් දැක්වූවාට.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනාව අනුව**
**2016.10.28 දිනැතිව කුරුවිට කුඩා නගර ජල ව්‍යාපෘතිය සඳහා මිලදී ගෙන ඇති ජල මෝටරය භාවිතාකරනලද මෝටරයක් බවට දැනගැනීමට ලැබී ඇති හෙයින්, ජල ව්‍යාපෘතියට සිදුවූ පාඩුව හා ඒ සම්බන්ධව විධිමත් පරීක්ෂනයක් ඉල්ලා සිටීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**2022.09.09 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-02 යටතේ ගනු ලැබූ තීරනයේ සත්‍ය උදෘතයක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**පෙ.ව. 11.20 ට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී චන්ද්‍රලතා බණ්ඩාර මිය අත්‍යවශ්‍ය කරුනක් සඳහා මහා සභා අවසරය ගෙන සභා ගැබෙන් නික්මිණ.**

**05-03. කොළඹ-රත්නපුර ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වන මෙනේරිපිටිය අළුපොත මාර්ගයේ දෙපස ලංකා විදුලිබල මණ්ඩලයෙන් රැහැන් අදින ලද විදුලි සම්බන්ධතාවක් නොමැති හෙයින් සූර්ය කෝෂ විදුලි පහන් සවිකිරීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>

**කොළඹ-රත්නපුර ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වන මෙනේරිපිටිය අළුපොත මාර්ගයේ දෙපස ලංකා විදුලිබල මණ්ඩලයෙන් රැහැන් අදින ලද විදුලි සම්බන්ධතාවක් නොමැති හෙයින් සූර්ය කෝෂ විදුලි පහන් සවිකිරීමට යෝජනා කරමි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මදුසංක මහතා</u>

මේ යෝජනාව ඉතා වැදගත්.නාරද මධ්‍ය මහා විද්‍යාලය,පරකඩුව විද්‍යාල ආදි සියළු විද්‍යාල මේ පාරේ තියෙන්නේ.ඇඟලුම් කර්මාන්තයේ රැකියා කර රාත්‍රියේ මේ මාර්ගයේ පියමං කරන පිරිසට මේ ඉතා වැදගත්.පන්සල් ,රජයේ නිලධාරින් සිටින කාර්යාල පිරිස් රැකියා කරන රසකැවිලි ආයතන ආදිය මේ මාර්ගයේ පිහිටලා තියෙනවාත මොන අයුරින් ගත්තත් මේ සේවය මේලෙස ලබාදීම වැදගත්.ගරු සභාපතිතුමා මේලෙසම විශාල සේවයක් මේ ප්‍රදේශයට ලබා දිලා තියෙනවා. ඒ ආ ගමන් මතට සුභ පතනවා.තව තවත් සේවය කිරිමට ශක්තිය දිරිය පතනවා.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

Xxxxxxxxxxxxxxx <u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතාගේ යෝජනාව අනුව</u> **කොළඹ-රත්නපුර ප්‍රධාන මාර්ගයෙන් ආරම්භ වන මෙනේරිපිටිය අළුපොත මාර්ගයේ දෙපස ලංකා විදුලිබල මණ්ඩලයෙන් රැහැන් අදින ලද විදුලි සම්බන්ධතාවක් නොමැති හෙයින් සූර්ය කෝෂ විදුලි පහන් සවිකිරීමට** ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**</u>

**05- 04. පත්බෙරිය සේවා පියස ඉදිකිරිම සඳහා බදු ලබාගැනීමට නියමිත දුම්රිය රක්ෂිත ඉඩම කඩිනමින් ප්‍රාදේශීය සභාව වෙත බදු ලබාගැනිමට කටයුතු සලසන ලෙස සිදු කරන යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>**

**පත්බෙරිය සේවා පියස ඉදිකිරිම සඳහා බදු ලබාගැනීමට නියමිත දුම්රිය රක්ෂිත ඉඩම කඩිනමින් ප්‍රාදේශීය සභාව වෙත බදු ලබාගැනිමට කටයුතු සලසන ලෙස යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>**

**2010 වර්ෂයේ සිට මේ සම්බන්ධව සභාවටත් ඉදිරිපත් කරලා සම්බන්ධීකරනයටත් කියලා කරුණු සොයාබලා කටයුතු කලා.රජයේ නිදැල්ලේ තියෙන භූමි සම්පත් මහජන සේවය සඳහා ලබාගැනීම අරමුණ.නමුත් ඒ අතරේ මේ ඉඩම පුද්ගලික ආයතනයකට බදු දීමට යන බවක් දැනගන්න ලැබී තියෙනවා.දුම්රිය දෙපාර්තමේන්තුවට රජයේ ඉඩම් රැසක් තියෙනවා.අපිට වොලිබෝල් පිටිය ඉඩම විතරයි.රජයේ සේවා පියස හදන්නයි ඉල්ලුවේ. මේ සියළු ස්ථාන එක තැනක පිහිටිම ඇත්තටම ජනතාවට පහසුවක්.බදුගන්න ඉල්ලුම් පත්‍රයක් දැම්මා.ජනාධිපතිතුමාට, දුම්රියදෙපාර්තමේන්තුවේ ප්‍රධාන අමාත්‍යාංශයට ඉල්ලිම් කලා.තව සොයාබලා අවශ්‍ය ස්ථාන දැනුවත් කරන්න.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා</u>**

**මේ සම්බන්ධව තව දුරටත් කරුණු සොයාබලා ඉදිරි කටයුතු කඩිනම් කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව</u> පත්බෙරිය සේවා පියස ඉදිකිරිම සඳහා බදු ලබාගැනීමට නියමිත දුම්රිය රක්ෂිත ඉඩම කඩිනමින් ප්‍රාදේශීය සභාව වෙත බදු ලබාගැනිමට කටයුතු කඩිනම් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

**05- 05 . වටප්පිටිය වැටුම්මල මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරනය කිරිමට රු.400000.00 ක් ලබාගැනීම සම්බන්ධ යෝජනාව**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>**

**වටප්පිටිය වැටුම්මල මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරනය කිරිමට රු.400000.00 ක ප්‍රතිපාදන ලබාදෙන ලෙස යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>**

**කිමි1ක් කාපට් කිරීමේ ව්‍යාපෘතියට දැම්මත් ඒ ව්‍යාපාතිය නැති නිසා මේවන විට ජනතාවට අත්‍යාවශ්‍ය වෙලා මේ කටයුත්ත.මාර්ගයේ ගමනාගමනය ඉතා අපහසුයි.**

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා :-**

**මට මතකයි අන්තර් ගම්මාන වැඩසටහන යටතේ අපි මාර්ග සංවර්දනය කලා.උඩුතලාවිටිය පොත්දෙනිය මාර්ගය කෙටසක් දැන් අබලන්.දැන් විශාල වලවල්.ගමේ අය තාවකාලිකව ප්‍රතිසංස්කරනය කලත් ඒක නඩත්තු කල යුත්තක්.පළාත් සභා වෙන් තාර දැම්මේ.ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවෙන් නඩත්තු වලට ප්‍රතිපාදනවෙන්කරනවා.පළාත් සභ.මේ කොටස නැවත සකසලා දෙන්න කියලා ඉල්ලීම් කරන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව වටප්පිටිය වැටුම්මල මාර්ගය තාර දමා ප්‍රතිසංස්කරනය කිරිමට රු.400000.00 ක ප්‍රතිපාදන ලබාදීමටඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**05- 06. පරකඩුව සතිපොල ඉදිකිරිමට පවරාගත් ඉඩමේ, 20 ප්‍රජාමණ්ඩලය හරහා කඩ කාමර 12 ක් ඉදිකර, ප්‍රාදේශිය සභාවට බිම්බදු මුදල් ලබාගැනීමට කටයුතු කිරිම සම්බන්ධ යෝජනාව.**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**

**පරකඩුව සතිපොල ඉදිකිරිමට පවරාගත් ඉඩමේ, 20 ප්‍රජාමණ්ඩලය හරහා කඩ කාමර 12 ක් ඉදිකර, ප්‍රාදේශිය සභාවට බිම්බදු මුදල් ලබාගැනීමට කටයුතු කිරිමට යෝජනා කරමි.**
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද විජේකුමාර මහතා**
එම යෝජනාව ස්ථිර කරමි.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**
වසර 15 කට පෙර පුස්සැල්ල වැව්ලි සමාගමෙන් ගත්තේ.පරකඩුව සතිපොල දාන්න ඉන්න ඉඩම.දැනට පරකඩුව සතිපොල තියෙන්නේ පොල් අතු සෙවිලි කඩ.පැලවල් වගේ.මහා අපකීර්තියක්.ඒ ලඟ පාසැලක් තියෙනවා.කෑගහන සද්දේ පොලේ .ඒක බාධාවක් පාසැලේ වැඩටත්.ඉඩම පවරගෙන මුල්ගලත් තිබ්බා.විශාල ප්‍රාග් ධනයක් හිරකරලා ගත්තේ.ඒ ඉඩම ජනතා සේවයට යොදා ගන්න පුළුවන්.20 ප්‍රජා මණ්ඩලය හරහා කඩ කාමර ඉදි කරවලා බිම්බදු ගන්න.යම් ක්‍රමයක් හදලා මේ කටයුත්ත කරමු.විදුලිය වැසිකිලි පහසුකම් ප්‍රජා මණ්ඩලය හරහා ගමු.අත්හදා බැලිමට කඩ 12 ක් හදමු.
**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා**

හොඳ යෝජනාවක්.සභාවේ මුදල් වැයකරන්න බෑ.ප්‍රජාමණ්ඩලය සමග නීත්‍යානුකූලව ගිවිසුම් ආදිය ගහලා කාර්මික නිලධාරී අදහස් ආදිය ගෙන කටයුතු කරමි.විධිමත්ව කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතාගේ යෝජනාව අනුව පරකඩුව සතිපොල ඉදිකිරිමට පවරාගත් ඉඩමේ, 20 ප්‍රජාමණ්ඩලය හරහා කඩ කාමර 12 ක්**

ඉදිකර, ප්‍රාදේශිය සභාවට බිම්බදු මුදල් ලබාගැනීමට නීත්‍යානුකූලව කටයුතු කිරිම ට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05- 07.** ප්‍රාදේශිය සභාවේ මුදල් තත්වය වඩාත් යහපත් කරගැනීම සඳහා මුදල් පාලන ක්‍රමයක් සකස් කිරීම සම්බන්ධ යෝජනාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

ප්‍රාදේශිය සභාවේ මුදල් තත්වය වඩාත් යහපත් කරගැනීම සඳහා මුදල් පාලන ක්‍රමයක් සකස් කිරීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මම යෝජනා 3ක් ඉදිරිපත් කලා. එකක් විසල් ජලය ලබාදීමේදි කුඩා නගර එකෙන් ජලය ගත් අයටත් මුදල් අයකරනවළු.ඒ නිසා ඒ අයකරන මුදල කුඩා නගර ජල ව්‍යාපෘතියෙන් දරන්න කියන යෝජනාව.ඒ යෝජනාව ජල කමිටුවට යොමු කරලා. ඒ තීරනයත් ඒ කමිටුවට යොමුකල බවත් ලිඛිතව ලබා දෙන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

ඒකට විශාල මුදලක් යයි.අපි සම්බන්ධතා ගලවන්නෑ.වෝටර් බෝඩ් එක්ක කතා කරමු.එකගතා ඕනි.නව මතයක් දෙන්න එපා. සභාවෙන් මුදල් ගෙවනවා කියලා.ජනතාවට.ඒක විශාල අපහසුතාවක්.තැන්පතු ඇති සොයා බලමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

අපි යම් කරුනු වලට සභාවේ අනුමත කරලා මුදල් පරිපූරක වෙන් කලාට ඒ මුදල් නෑ. ඒවා නිසිපරිදි කලමනාකරනය වෙලා නෑ. උදාහරන කුරුවිට නගරයේ සම්මන්ත්‍රන ශාලාව.ඉතින් ඒනිසා අළුතින් මුදල් ගෙව්වා. 22.06.10 දින සභාවේ 5-9 යටතේ 50% ක් ගෙවන්න තීරනය කලා.ගිය සභාවේ කතා උනා අපිට කෝටියක් හම්බ උනා ලක්ෂ 75 ක් ගෙව්වා. සභාවේ වෙනත් සංවර්ධන කටයුත්තකට තිබුන මුදල් අහිමි උනා.ඩීසල් වලට වැය කරන මුදල ඉතා අධිකයි.ගමන් බිමන් පාලනය කර ගත යුතුයි.මෙ අවස්ථාවේ හැකිතාක් මුදල් ඉතිරිකරගත යුතුයි. වැසිකිලි ,වතුර ,ජනතාවට දැඩි ගැටළු.අසීරු කාලේ කැපවීමක් කරලා මුදල් පාලනය කරලා ජනතාවට අත්‍යවශ්‍ය දේට කැපකරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා

ජනතාවට උපතේ සිට මරණය දක්වා සේවා සැපයිය යුතුයි.කොයි වෙලේ ආපදා වෙයිද දන්නෑ. අයවැයේ ප්‍රාග්ධන ආදායම ගැන බලාපොරොත්තු තියලා නෑ.මිට වඩා සැලකිලි වෙන්න ඕනි.අරපිරිමැස්ම තියෙන්න ඕනි.මංගල මන්ත්‍රී කීවා වගේ ආර්ථිකය මීට වඩා සන්නද්ධ වෙන්න ඕනි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා :-

ජනතාව අපිට වසර 4 කට ජනතා වරම් දුන්නා.45 ක් ආවා. එක් අයෙක් සභාපති.පනතේ තියෙනවා අපි කල යුතු දේ.ආයතනයේ කටයුතු කරන්න මග පෙන්වනවා.මෙතනින් කිසිවක් අපි පුද්ගලිකව එලියට නොගෙනිය යුතුයි.ජනතාවගේ සේවා ඉටුකිරීමේ වගකීම් දරන්නයි ආවේ.අතීතයේ හිටපු ඒ මැම්බර්ලා චෝදනා ලබලා නෑ. උදව යකඩ තාච්චි නැතිවෙලා නෑ. පඩිත් අරන් නෑ.ඒ කාලේ අය ලිං හදලා වැසිකිලි හදලා සේවා පරාසය ඉතා පුළුල්.නමුත් චෝදනා ලබලා නෑ. මේවා විධිමත් වෙන්න ඕනි.අපි එක කණ්ඩායමක්.වාද විවාද කරලා පොදු තීන්දුවකට කටයුතු කරන.

සියල්ල ක්‍රමවත් විය යුතුයි.සමහරු හිතනවා අසවලා වැඩියෙන් වියදම් කරලා කියලා.අර්බුධ තේරුම් අරන් මේවා ට නිසි ක්‍රමවේද හදන්න.ජල ව්‍යාපෘතිය හරි වැදගත්.මේ මුදල් ප්‍රමානයක් රැස්වෙන්නේ එදාසිට මැම්බර්ලාගේ කැපවීමේ සිටයි.ගෙවල්වල අරපිරිමැස්ම වගේ මහජන මුදල් ඊටත් වැඩි පිරිමැස්මක් තිබිය යුතුයි.ජනතාවට වැඩි ප්‍රතිලාභ ලැබෙන දේට මුදල් යොමු කරන්නඕනි.පසුගිය සමයේ බුද්ධියෙන් මුදල් වැය නොකල නිසා අපිට විතරක් නෙමේ. රටේත් ගැටළු.ඒ තුල රටම පීඩාවේ.සමස්ත සභා ප්‍රෙද්ශයේ ජනතාව වෙනුවෙන් මේ මුදල් සුරක්ෂිත කරන්න.ලංකාවේ තියෙන ඇතැම් පලාත්පාලනආයතන බැලුවාම මේ සභාව හොඳයි.සමහර සභාවල පඩි ගෙවන්නත් මුදල් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා

රටම පත්වෙලා තියෙන ආර්ථික අර්බුදය හමුවේ මේ කෙරේ අපත් විශේෂ අවධානය යොමු කල යුතුයි.පළාත් පාලන ආයතනයක් ලෙස ඒ කාරණය අපිටත් අදාලයි.සභාව විධිහට අයවැය දිහා බැලුවාම ආදායම් ගන්න දේවල් මග ඇරිලා.ආදායම අඩුවෙනකොට වියදම් පාලනයක් කල යුතුයි. නැත්නම් බංකොලොත් වෙන්න පුළුවන්.මීට වඩා සැලකිලි වෙලා අවධානය යොමු කරලා මානව සම්පත් නිසි පරිදි යොදවලා ආදායම් වැඩිකරන්න.වියදම් අඩුකරගන්න වැඩ පිලිවෙලක් හදන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා

ලේකම්තුමිය අනවශ්‍ය වියදම් පාලනය සඳහා පියවර ගන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාව අනුව ප්‍රාදේශිය සභාවේ මුදල් තත්වය වඩාත් යහපත් කරගැනීම සඳහා මුදල් පාලන ක්‍රමයක් සකස් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx

05- 08. 2023 අයවැය සකස්කිරිමේදී ප්‍රාදේශිය සභා කොට්ඨාශ පදනම් කරගෙන මුදල් ප්‍රතිපාදන වෙන්කිරිමට කටයුතු කිරිම සම්බන්ධ යෝජනාව

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

2023 අයවැය සකස්කිරිමේදී ප්‍රාදේශිය සභා කොට්ඨාශ පදනම් කරගෙන මුදල් ප්‍රතිපාදන වෙන්කිරිමට කටයුතු කිරිමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා :-
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
ප්‍රතිපාදන වෙන්කිරීමෙදි යම් වෙනස්කම් තියෙනවා.යම් තැන් වලට විතරයි යන්නේ. ඒ නිසා **මේ ප්‍රතිපාදන කොට්ඨාශ පදනම් කරගෙන දෙන්න. සැලැස්මක් නැති නිසා වසම් මග ඇරෙනවා.පොදු සංවර්ධනයකුයි වෙන්න ඕනි.මේ වසරේ මුදල් නැනේ.චක්‍ර ලේඛ වෙනස් උනත් දැන් මුදල් නෑ.ඒ අනුව 2023 අයවැය මගින් හරි හරි මේ තත්වය වෙනස් කරලා කොට්ඨාශ පදනම් කරගෙන මුදල් ප්‍රතිපාදන වෙන්කිරිමට පියවර ගන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතාගේ යෝජනාව අනුව 2023 අයවැය සකස්කිරිමේදී ප්‍රාදේශිය සභා කොට්ඨාශ පදනම් කරගෙන මුදල් ප්‍රතිපාදන වෙන්කිරිමට කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා

**05-09. කීරගල බෝපත් සමාධි ධර්මායතනයේ( බෝපත් අසපුවේ ) ධර්මශාලාව අළුත්වැඩියා කිරිමට ප්‍රතිපාදන ලබාගැනීම සම්බන්ධ යෝජනාව**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා
**කීරගල බෝපත් සමාධි ධර්මායතනයේ( බෝපත් අසපුවේ ) ධර්මශාලාව අළුත්වැඩියා කිරිමට ප්‍රතිපාදන ලබාදෙන ලෙස යෝජනා කරමි.**
මාගේ බිරිඳගේ අසනීප අවස්ථාවේ මාහට විවිධ අයුරින් ප්‍රවාහන පහසුකම් සපයාගැනීමට උපකාර කල ලේකම්තුමියට ත් ආර්.ටී.එස්.ලලිත් මහතාටත් ස්තුතියද මේ අවස්ථාවේ කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-
පළාත් සභාප්‍රතිපාදන මගින් සිදුකිරිමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඉල්ලා සිටිමු.

මේ අවස්ථාවේ ගරු මන්ත්‍රිතුමන් විසින් එම විහාරස්ථානය සම්බන්ධ වර්තමාන තත්වය පිලිබඳව අදහස් රැසක් ප්‍රකාශ කල අතර එම කරුණු සභාව මගින් මැදිහත්වී විසඳිය හැකි නොවන කරුණු බැවින් ඒවා ශාසනාරක්ෂක බල මණ්ඩලයට හෝ සුදුසු නීතිමය ප්‍රතිපාදන ලබාගතහැකි ස්ථානයකට යොමු කරන ලෙස පොදුවේ සාකච්ඡා විය.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් යෝජනාව අනුව කීරගල බෝපත් සමාධි ධර්මායතනයේ( බෝපත් අසපුවේ ) ධර්මශාලාව අළුත්වැඩියා කිරිම පළාත්**

සභා ප්‍රතිපාදන යොදවා සිදුකිරිම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඉල්ලා **යොමු කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රණතුංග මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා**

**05-10. ගලුකාගම ග්‍රාමසේවා වසමේ ටී.ආර්.අයි. හරහා ගුලනගොඩ ගම්මානයට යාමට භාවිත වන මාර්ගය ප්‍රාදේශිය සභාවට පවරාගැනීම සම්බන්ධ යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රණතුංග මහතා**

**ගලුකාගම ග්‍රාමසේවා වසමේ ටී.ආර්.අයි. හරහා ගුලනගොඩ ගම්මානයට යාමට භාවිත වන මාර්ගය ප්‍රාදේශිය සභාවට පවරාගැනීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රණතුංග මහතා**

**ගලුකාගම ග්‍රාමසේවා වසමේ ටී.ආර්.අයි. හරහා ගුලනගොඩ ගම්මානයට යාමට භාවිත වන මාර්ගය වසර 50 ක් පමන තිස්සේ ගම්මු භාවිත කල එකක්.මේ මාර්ගයේ ටී.ආර්. අයි. එකෙන් ජල නල එලන්න දෙන්නේ නෑ. ගමට වතුර ගන්න.මේක අසාධාරනයි.නිලදාරින් මේකට ඉඩ දෙන්නේ නෑ.ගමට සේවා ලබා ගැනීමට බාධාවක්.සම්බන්ධිකරනයෙදි කිව්වා .ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට කීවා.නමුත් මාර්ගය පවරාගත යුත්තේ සභාවෙන්ළු.ජනතාව වෙනුවෙන් ලබාගත යුතුම ජලය ලබාගන්න දෙන්නේ නෑ.මානුෂීය නෑ.හිටපු ගරු ජනාධිපතිතුමා, දේශපාලන නියෝජිතවරුන්ට කීවාට පලක් උනේ නෑ. මේ මාර්ග සම්බන්ධ ගැටළු විසඳන්න.** සමහර මාර්ග ගැටළු කාර්මික නිලධාරි පරික්ෂා කලත් ඉන් ඉදිරියට ගිහින් නෑ.මේවා විසඳන්න. මේ මාර්ගය සභාවට පවරාගන්න කඩිනමින් කටයුතු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා**

මේ ගම්මානයට අතුරු මාර්ගයක් තියෙනවා. ඒක සභාවට පවරාගන්න.ජලය ලබාගැනීමෙදී ගැටළු උනා. ගෙවල් 10ක් තියෙනවා.ගොඩැල්ලෙ.එක ගෙයක් ලඟින් ගම්සභා පාර තියෙනවා.පස්සෙ ඒක වැහුණා.නල එලීමේ දි හිතුමතේ බෑ.අවසර ගන්න ඕනි.තලවකැලේටයි අයිති.හිතුමතේ පිරිස ගිහින් වැඩ කරන්න බෑ.ගේට්ටුදාලා වහලා තියෙන,ආරක්ෂක නිලධාරියෙක් දාලා තියෙන පාරක්.ඒක අපේ පාරක් නෙවේ.නමුත් ගමේ පිරිසගේ අවශ්‍යතාවය අනුව සුහදව කටයුතු කල හැකියි.තලවකැලේ ප්‍රධාන කාර්යාලයෙන් අවසර ගන්න ඕනි.එදා නල එලන්න ගියාට කව්රුත් දන්නේ නෑ.සුහදව කටයුතු කල යුතුයි.ඒ මාර්ගය ටි.ආර්.අයි.වතුයායට අයිත් එකක්.ඒක සභාවට ගන්න බෑ.අර පෙර කොටස පුළුවන් සුහදව කතා කරලා.ඒ ගොඩැල්ලට ජලය ගන්න පුළුවන්.පායනකොට අපි ජලය ගන්නෙත් ටි.ආර්.අයි එකෙන්.මේ ආයතනය සභාවට ගරු කරනවා.චෝදනා කරන්න බෑ. එක පාරට.ඉල්ලීම කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රණතුංග මහතා**

ඒ ආයතන ප්‍රධානියාගේ හඬ ඇහුනේ.ජනතා අවශ්‍යතාවය වගේම ඒඒ ආයතනයේ සුහදත්වය රුචිකත්වය අනුව තීන්දු තීරන ගන්න වෙලා.මෙතනදි මාර්ගය පවරා ගැනිම පොදු කටයුත්තක්.ආයතනයේ මිනිස්සුන්ට ඕනි විධිහට තීන්දු තීරන ගන්න බෑ.මම දන්න විධිහට මේ කරුණ කල් ඇතිව වාචිකව දැනුවත් කරලා. නමුත් පස්සෙ විරුද්ධ වෙලා.මෙතුමා කියනවා

පවරා ගන්න බැරිලු.මේ වසර 30ක් 40ක් යන එන පාර.සුහදත්වය මත පැහැදිලි කලා.එතුමාගේ මතය ඒ. මේ මාර්ගය පවරාගන්න කටයුතු කරන්න.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා :-

ගම්මුන්ගේ පාර අවශ්‍ය බවට අත්සන් ලේඛනයකුත් අරගන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**ගලුකාගම ග්‍රාමසේවා වසමේ ටී.ආර්.අයි. හරහා ගුලනගොඩ ගම්මානයට යාමට භාවිත වන මාර්ගය ප්‍රාදේශිය සභාවට පවරාගැනීම සම්බන්ධව කාර්මික නිලධාරී වාර්තා ලබාගෙන පවරාගැනීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රණතුංග මහතාගේ යෝජනාව අනුව ගලුකාගම ග්‍රාමසේවා වසමේ ටී.ආර්.අයි. හරහා ගුලනගොඩ ගම්මානයට යාමට භාවිත වන මාර්ගය කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන, ප්‍රාදේශිය සභාවට පවරාගැනීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

05- 11. 2023 වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සම්බන්ධ

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ 2023** වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට පෙර මේ සම්බන්ධව සාකච්ජා කිරිමට කාරක සභාවක් බවට පත් විමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

**2023** වර්ෂයේ අයවැය කෙටුම්පත සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට මෙම කෙටුම්පතට තව දුරටත් ඇතුලත්වියයුතු යෝජනා ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

මේ කටයුත්තට වෙනත් දිනයක් යොදාගන්න. කරුනු රැසක් ඉදිරිපත්කල යුතුව තිබෙනවා.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා :-

එදා අයවැය කෙටුම්පතට කරුනු ගත් දිනයේදි මමත් ආවා.වසරක්තුල අප කල යුතු දේයි සාකච්ජා කල යුත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි මිය**

කුරුවිට බස්නැවතුම්පලේ ගැබිණී මව්වරුන්ට හා කිරිදෙන් මව්වරුන්ට කුඩා ස්ථානයක් වෙන් කර දීමට යෝජනා කරමි. දරුවෙකුට මව්කිරි දීමේදී අම්මාවරු දැඩි අපහසුතාවයට පත් වෙනවා.ඒ නිසා මේ කටයුත්ත ට කුඩා ඉඩක් දෙන්න

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මුදිතා ශ්‍රිමතී මිය.**

එම යෝජනාව ස්ථිර කරමි.මීට පෙරත් මේ ගැන කතා කලාට කෙරුනේ නැ.කිරිදෙන මව්වරුන්ට ස්ථානයක් ලබාදෙන්න. එසේම ගැහැනු දරුවන්ට සනීපාරක්ෂක තුවා මාරු කිරිම

සඳහා සුදුසු ස්ථානයක් ද ලබාදෙන්න.නැවත සනීපාරක්ෂක පහසුකම් ලබාදෙන අවස්ථාවක හෝ එවැනි ස්ථානයක් ලබා දීම වැදගත්.වැඩිහිටියන් දෙමාපියන් ලබාගන්න ස්ථානයක්ද සැකසීම වැදගත්.උදේ සිට හවස දක්වා උනත් වැදගත්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී මිය**

දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරිමට යෝජනා කරමි. මේ බල ප්‍රෙද්ශයේ කතුන් රැකියා කරනවා.විශාල රජයේ ආයතන රැසක් මේ සමීපයේම තියෙනවා.රැක බලා ගත යුතු දරුවන් ගෙවල්වල දාලා ඉන්නේ.ඒ නිසා සභාවෙන් මේ දරුවන්ට දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් හදන්න.කීපදෙනෙක් සේවයේ යොදවලා මුදල් අරගෙන කරන්න.යථා කලෙදි හරි ක්‍රියාත්මක කරන්න.ආදායමක් සභාවට ගන්නත් පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී මුදිතා ශ්‍රිමතී මිය.**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා**

මේක හොඳ වැඩක්. කුරුවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන්මේ වැඩේ පටන් අරන්. සියයට හැටක් පමන වැඩ නිම කරලා. ළමා සුරැකුම් මධ්‍යස්ථානයයි. පෙර පාසැලයි.පුස්ථකාලේ උඩතට්ටුව හදලා ගන්නත් පුළුවන්.පුස්ථකාලේ උඩට අරන් පහල දාන්න පුළුවන් මේක.සභාවට ආදායම් එන ඒවා. ජනවාරි හරි කරමු.ආයෝජකයන් හොයමු.ගයා එකේ රෝහිත මහත්තයාගේ ආයතනයේ කසල නිසි ලෙස ගන්නේ නැතිලු.සොයා බලන්න.අපිට උදව් ගන්න හැකි අය.සභාපතිතුමා කතාකරන්න.අපිට කතාකරන්න අවස්ථාවක් ලබාදෙයි.වැසිකිලියටත් උදව් කරයි.ලයිට් දුන්නා කර්මාන්ත පුරේට. ඒ වගේ කසල වැඩෙත් සාර්ථකව කරමු.

එසේම මේ සියළුම මන්ත්‍රී කොට්ඨාශ වල මේවනවිට සුසානභූමි මිනිස්සු අනවසරයෙන් අල්ලාගෙන.දෙල්ගමුව සුසාන භූමියට නඩුත් කීවා.කඳංගොඩ සුසාන භූමිය කම්බි වැටවල් ගහලා.ඉස්සර ඇත්තටම ශ්‍රමදාන කලා.කම්කරුවෝ ටික දිනකට හරි මට දෙන්න.සුසානභූමිය සුද්ද කරන්න. අපේ බහුතරයක් කම්කරුවෝ වැඩ නෑ.විශාල ප්‍රමානයක් කම්කරුවෝ ඉන්නවා. නමුත් වැඩ අඩුයි.සුසානාගාරයේ පිරිස වැඩ කරනවා.ඒ වගේමයි.සමහර සේවකයන් අපේ වාහනවල ගමන් කරලා ගමන් වියදම් ගන්නවා.නිකං කොළවල අත්සන් කරලා.ඒ වගේ වැඩ කරන්න එපා.මේ අපේ ධුර කාලය සමහර විට අවසන් වේවි.ඒ නිසා මේකාලෙත් හැකි තරම් වැඩ කරමු.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

ලිඛිතව ඉල්ලන්න සුසානභූමිය පවිත්‍ර කිරීමට සේවකයන්. ඒ කටයුත්ත කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී මිය**

කුරුවිට නගරයේ පොදු වැසිකිලිය හදද්දී කුඩා ළමුන්ට ගැලපෙන ලෙස කොමඩ් එකකුත් හදමු. අවුරුදු 5 ට අඩු අයට ගැලපෙන එකක් අල්ලන්න. හරිම වැදගත්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා**

අයවැය කෙටුම්පතේ ආදායම් වැඩිකිරීම පැත්ත ගැන විශේෂ අවධානයක් දෙන්න ඕනි.සමහර අංශ ආදායම් උපද්දන්නේ නැතිතරම්. ප්‍රචාරක දැන්වීම් ස්ථිර පුවරු 2023 වසරට ලක්ෂ 11යි.ව්‍යාපාර කරන අයට කතා කරලා මේ ආදායම් වැඩිකරගත හැකියි.සාමාන්‍ය බදු වලටත් වඩා ව්‍යාපාර කරන අයට කතා කරලා මේ ආදායම් වැඩිකර ගමු.එසේම ඉඩම් සේල් 2023

බලාපොරොත්තු ආදායම ලක්ෂ 55 යි.මේ ආදායම් පෙර හා පසු වර්ෂ එක්ක ගනිද්දි තව දුරටත් වැඩිකර ගත හැකි ආදායම්.ඉඩම් සේල්වලට අදාලව මේ ආදායම් පිලිබඳ නිවැරදිව ගනනය කරලා වැඩි ආදායමක් ගත හැකියි.

මෙහිදී කාරක සභා අවස්ථාවේ ඉඩම් සේල් ආදායම් තත්වය සම්බන්ධව දිර්ඝ වශයෙන් සාකච්ජා කල අතර මුද්දර ගාස්තු ,පිලිබදවද සාකච්ජා විය.දීර්ඝ වශයෙන් සාකච්චා කල යුතු බවට තීරනය වු බැවින් නැවත දිනයක් මෙම අයවැය කෙටුම්පත පිලිබඳව සාකච්ජා කිරීමට යොදාගැනීමට නියම කරගන්නා ලදි.ඒ අනුව ගරු **උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ හා** **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අසංක දිල්ෂාන් මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව පිලිබඳ මහා සභාව බවට පත්විය. තව දුරටත් කරුණු සාකච්ජා කල යුතු බවට මතය වූ හෙයින් අයවැය කෙටුම්පත පිලිබදව විශේෂ මහා සභා රැස්වීමක් ගරු සභාපතිතුමාගේ යෝජනා කිරීමෙන් 2022.09. 20 දින පෙ.ව.10.00 ට කුරුවිට ප්‍රාදේශිය සභාවේදි පැවැත්වීමට යෝජනා වූ අතර එය ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ඒ අනුව** සභාවේ මතය විමසීමෙන් පසු **2022. 09.20 දින** පෙ.ව.10.00 ට **2023 අයවැය කෙටුම්පත පිලිබඳ විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**

**05-12.** **1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 147-149,152( i) හා 150 (( i) වගන්ති යටතේ 2023 වර්ෂය සඳහා ගාස්තු අයකරනු ලබන වෙළඳ බලපත්‍ර/ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු ගැසට් පත්‍රයේ පල කිරිම සඳහා මහා සභා අනුමැතිය ලබාගැනීම සම්බන්ධ යෝජනාව**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 147-149,152( i) හා 150 (( i) වගන්ති යටතේ 2023 වර්ෂය සඳහා ගාස්තු අයකරනු ලබන කුරුවිට ප්‍රාදේශි සභා බල ප්‍රදේශයට අයත් පහත සදහන් වෙළඳ බලපත්‍ර/ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු ගැසට් පත්‍රයේ පල කිරිම සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.**

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147-149වගන්තිය යටතේ 2023 වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු පැනවීමට අදාල තොරතුරු**

| **අනු අංකය** | **I වන තීරුව**<br>**බලය දෙනු ලබන කාර්යය** | **II වන තීරුව**<br>**පරිශ්‍රෙය් වටිනාකම රුපියල්** | | |
|---|---|---|---|---|
| | | රු. 750.00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ට වැඩි එහෙත් 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| | | | | |
| | අප්‍රසන්න වෙළඳාම | | | |
| | | | | |
| **1.** | සිල්ලර වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| **2.** | සමූපකාර වෙළඳසැලක් | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| **3.** | බිම්මල් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **4.** | සංචාරක වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| **5.** | ශීත කළ මස්මාළු අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **6.** | ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **7.** | ඡායාරූප ශාලාව | 500.00 | 750.00 | 1000.00 |
| **8.** | ලිහිසි තෙල් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **9.** | බිත්තර අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **10.** | කිරි ආශ්‍රිත නිෂ්පාදන හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **11.** | අයිස්ක්‍රීම් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **12.** | රස කැවිලි, බයිට් වර්ග අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **13.** | කරවල වර්ග අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **14.** | සුරතල් මසුන් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **15.** | සුළු අපනයන බෝග අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **16.** | එළවළු වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| **17.** | පළතුරු වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| **18.** | සුරතල් සතුන් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **19.** | සාප්පු බඩු අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **20.** | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **21.** | පාවහන් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **22.** | නිමි ඇඳුම් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **23.** | පොත්පත් ලිපි ද්‍රව්‍ය අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **24.** | පිඟන්,ඇලුමිනියම්,ප්ලාස්ටික් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **25.** | ඇස් කණ්ණාඩි අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **26.** | ලොතරැයි අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **27.** | මෝටර් රථ අමතර කොටස් අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **28.** | මල් පැල හා වෙනත් පැල අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **29.** | මැටි භාණ්ඩ නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **30.** | පැණි හෝ හකුරු නිපදවීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **31.** | අභ්‍යාස පොත් නිපදවීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **32.** | දුම්කොළ ගබඩා කිරීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| **33.** | සත්ව ආහාර නිපදවීම හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
**දිගෝගෙදර ,ඇහැලියගොඩ පී.ඒ.ශ්‍රියාලතා මිය විසින් 2017.07.31 දිනට හිඟව තිබු වරිපනම් බදු මුදල් ගෙවා ඇති අතර ප්‍රධාන කාර්යාලයේදි කරන ලද විරෝධතා පරීක්ෂනයේදී වරිපනම් අංක 129 හා 129/1 ඇස්බැස්ටස් හා උළු සෙවිලි නිවාස ලෙස සංශෝධනය කර ඇති බවත් එල්ලාවල උප කාර්යාලයට ඒ බව දැනුම් නොදීම මත , ප්‍රධාන කාර්යාලයෙන් සිදුවි ඇති අතපසුවිම හේතුවෙන් 129 සිල්ලර කඩය අඛන්ඩව බිල්කර ඇති බැවින් හිඟයක් සටහන්ව ඇති බවත් මේ සම්බන්ධව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2022.08.13 දිනැති ලිපියේ අනු අංක 05 යටතේ සඳහන් සිදුවී ඇති අතපසුවීම සම්බන්ධයෙන් වරිපනම් ලේඛනයේ සටහනක් යොදා 129 සිල්ලර කඩය සදහා වූ රු.10036.32 මුදල හා දේපල කපාහැරිමට සභාතීරනයක් ගෙන කටයුතු කිරිම සුදුසු බව පෙන්වා දි ඇත.ඒ අනුව මෙම ගැටළුව නිරාකරනය කල යුතුය.**

<u>ගරු ප්‍රාදේශීය සභාඋප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව අනුව දිගෝගෙදර ,ඇහැලියගොඩ පී.ඒ.ශ්‍රියාලතා මිය හට අයත් 129 සිල්ලර කඩය සදහා වූ රු.10036.32 ක හිඟ මුදල ලෙස සටහන්ව ඇති මුදල සහ දේපල වරිපනම් ලේඛනයේ සටහනක් යොදා කපාහැරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

**2022.09.09 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05- 23 යටතේ ගනු ලැබූ තීරනය**

**05-23. කුරුවිට ප්‍රාදේශීය සභාවේ නීති කටයුතු සඳහා නීතිඥවරයෙකු පත්කොට නීත්‍යානුකූලව ගෙවීම්කර සේවාව සඳහා වන යෝජනාව.(මෙම යෝජනාව සඳහා 2021.05.17 දිනැති මහා සභා වේ අනුමැතිය ලැබි ඇතත්, එදින න්‍යාය පත්‍රයට ඇතුලත් නොවී ගත් තීන්දුවක් බැවින් නීත්‍යානුකූල කිරිම සඳහා වන යෝජනාවකි.)**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ නීති කටයුතු සඳහා නීතිඥවරයෙකු පත්කොට නීත්‍යානුකූලව ගෙවීම්කර සේවාව ලබාගැනීමටත් ඒ වෙනුවෙන් නීතිඥ ජනක සුමේධ මහතාගේ සේවය ලබාගැනීමටත් යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභාඋප සභාපති අනිල් ලියනගේ මහතා :-**

**එම යෝජනාව ස්ථිර කරමි**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**මේ සඳහා සඳහා වන යෝජනාව 2021.05.17 දිනැති මහා සභා වේ අනුමැතිය ලැබි ඇතත්, එදින න්‍යාය පත්‍රයට ඇතුලත් නොවී ගත් තීන්දුවක් බැවින් නීත්‍යානුකූල කිරිම සඳහා ඉදිරිපත් කරමි.මේ වනවිට 2021.05.17 දිනැති සභා තීරනය පරිදි නීතිඥ ජනක සුමේධ මහතා ප්‍රාදේශීය සභාවේ නීති කටයුතු සඳහා පත්කරගෙන ඇති අතර එම නීතිඥ ජනක සුමේධ මහතාගේ සේවයම ඉදිරියටත් ලබාගමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ නීති කටයුතු සඳහා නීතිඥවරයෙකු පත්කොට ගෙවීම්කර සේවාව ලබාගැනීමටත් ඒ වෙනුවෙන් නීතිඥ ජනක සුමේධ මහතාගේ සේවය ලබාගැනීමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**2022.09.09 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05- 23 යටතේ ගනු ලැබූ තීරනයේ සත්‍ය උද්‍ධෘතයක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**05- 24. අංක pF 7449 දරණ කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් යුනයිටඩ් මෝටර්ස් ලංකා ආයතනය වෙත රු.663465.79 ක් ගෙවීම් කිරිම සම්බන්ධ යෝජනාව**

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**</u>

**අංක pF 7449 දරණ කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් යුනයිටඩ් මෝටර්ස් ලංකා ආයතනය වෙත අංක 1332 හා 2022.08.24 දිනැති වවුචර් පතින් රු.663465.79 ක් මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කිරිම සිදු කර ඇති අතර ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා :-**</u>

**එම යෝජනාව ස්ථීර කරමි**

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**</u>

**මෙම කැබ්රථය ධාවනයේදී යාන්ත්‍රික කොටස්වල අනවශ්‍ය ශබ්ද නිකුත්වීම හා එහි යතුර භාවිතාකර ඉන්ජිම පනගැනිවීමෙන් පසුව යතුරෙන් ක්‍රියාවිරහිත කිරිමට නොහැකිවිම ආදී කාර්මික දෝෂ සකසා අළුත්වැඩියා කටයුතු සිදු කිරිම එහි නිෂ්පාදිත ආයතනය යුනයිටඩ් මෝටර්ස් වෙත යොමු කර සිදු කර ගන්නා ලදී. මේ සඳහා 22.08.18 දිනැති කාර්මික කමිටු අනුමැතියද ලබා දී ඇත.මෙම වාහනය අළුත්වැඩියාව කල පසු එම ආයතනයේ තව දුරටත් තැබිමට නොහැකිවීම හා ගෙවීම් කරන තුරු වෙනත් වාහනයක් කුලියට ගෙන වියදමක් දරා භාවිත කල නොහැකි හෙයින් මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව අංක 1332 හා 2022.08.24 දිනැති වවුචර් පතින් රු. 663465.79 ක් ගෙවිම කටයුතු කරන ලදී.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව අනුව අංක pF 7449 දරණ කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් යුනයිටඩ් මෝටර්ස් ලංකා ආයතනය වෙත අංක 1332 හා 2022.08.24 දිනැති වවුචර් පතින් රු.663465.79 ක් මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් කිරිම සිදු කර ඇති අතර ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

2022.09.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-25 යටතේ ගනු ලැබූ තීරනය

05-25. කුරුවිට ප්‍රාදේශීය සභා මහජන ක්‍රීඩාංගනය සඳහා තණකොළකැපීමේ යන්ත්‍රයක් මිලදීගැනීම සඳහා වන මිල ගනන් සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කුරුවිට ප්‍රාදේශීය සභා මහජන ක්‍රීඩාංගනය සඳහා තණකොළකැපීමේ යන්ත්‍රයක් මිලදීගැනීම සඳහා නිශ්පාදන ආයතන වලින් වන මිල ගනන් කැඳවූ අතර ඒවා පහත පරිදි වේ.

| අනු අංකය | ආයතනය | විස්තරය | මුදල රු. | වෙනත් විස්තර | මුළු මුදල රු. |
|---|---|---|---|---|---|
| **01** | **Osanta Enterprises, 38 Gamunu mawatha Horenthuduwa, Moratuwa.** | Hevy duty medow slaser (28*30)<br>Traler seat<br>Kubota h.p.8 Tractor | 220000.00<br>75000.00<br>825000.00 | Should you be willing to be accept out quotation please give us and advance 50% of the quotation value of commence the service this quotation is only valid in to one week | 1120000.00 |
| **02** | **Sirisena Moters , 117/c, Rukgha thotupola Road, Alubomulla, panadura.** | Tractor<br>Grass cutting machine | 975000.00<br>325000.00 | | 1300000.00 |
| **03** | **Ground Master, P.M Fernando Road, koralawella, Moratuwa.** | Tractor<br>Grass cutting machine | 1225000.00<br>350000.00 | | 1575000.00 |
| **04** | **JNB Auto Traders, No 67, Wijaya mawatha, Peellawatha, Andiambalama** | **Slasher for four wheel Tractors**<br>**Make** -JNB<br>**Year of manufacture** -2022<br>**Gearbox** -turkey/china<br>**PTO shaft** -clutch type | 425000.00 | **Price validity** - 14 days from 31/08/2022<br>Completion – within 14 days after delivery | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | **Cutting with** – 44”<br>**Body** -3mm M.S. sheet | | **Payment** – within 10 days after delivery<br>**Transport** – to be arranged by the kuruwita pradeshiya shaba<br>**Warranty** – 06 months from the date of delivery | |
| **05** | **M&L Agro Machinery, NO 18 De Silwa Mawtha, Negambo** | **Rotary slasher for four wheel tractor -** (for tafe/240-tractor/135-tractor<br>**Rotary slasher for four wheel Tractor** -( for /sonlika/Jhon Deer/New Holand/Mahendra/Standard)<br><br>**Brand** - SEMUTHU Rotary slasher<br>**Make & Model** -60 super (four wheel tractor driven rear mounted)<br>**Country of Origin** –Srilanka (Gear box 40hp ,PTO shaft & blades from chaina)<br>**Availability & supply** –one receipt of the payment (ex stork)<br>**Safety & spares** –safety devisers available on the slasher & spares freely available.<br>**Operation speed** – able to drive with 540 P.T.O shaft with clutch<br>**Blades/chain** –blades made out of high carbon steel<br>**Cutting width** – 4.6 feet/140.3cm(approximately)<br>**Transmission** – consist of heavy duty P.T.O shaft with clutch<br>**Ratio** – 1.2.83 (Approximately )<br>**Weight** – RS60 super 200kg/PTO-20kg/Blades-06kg | 400000.00<br><br><br><br>405000.00 | **Warranty & validity** -06 month against manufacturing defects, and quotation is valid only for 30 days<br>**Transportation** – Not provide<br>**Other features**- rotry slashers are suitable to cut heavy grass and has the facility to adjust the cutting height.<br>Slashers can be carried with tractor,safly.<br>Catalog/user gide –will be issued in Sinhala and English.<br>After sales service-As and when required during the warranty period,and thereafter on payment basis.<br>**Spares**-available at Seemuthu Agro head office,Negambo. | |

තණ කොළ කැපීමේ යන්ත්‍ර සඳහා ඉහත මිළ ගණන් පත් අනුව ඒ ඒ ආයතන විසින් නිෂ්පාදනය කරනු වර්ග කීපයකින් යුත් යන්ත්‍ර සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති බැවින් එනම් **JNB Auto**

**Traders,** හා **M&L Agro Machinery** යන ආයතන දෙක විසින් tafe/240-tractor/135-tractor /sonlika/Jhon Deer/New Holand/Mahendra/Standard යන මහ ට්‍රැක්ටර් රථයකට සම්බන්ධ කර තණ කොළ කැපීමේ **slasher** 01ක් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති අතර අනෙක් ආයතන විසින් අත් ට්‍රැක්ටර්යකට **slasher** 01ක් සම්බන්ධ කර සකස් කරනු ලබන අත්ට්‍රැක්ටරය සමඟ තණ කොළ කැපීමේ යන්ත්‍රයකට මිළ ගණන් ඉදිරිපත් කර ඇති බැවින් ඒ ඒ යන්ත්‍රවල පිරි විතරයන්ද එකිනෙකට වෙනස් වන අතර එබැවින් මෙම මිළ ගණන් පත් අතුරින් මෙම සභා ක්‍රීඩාංගනයට සුදුසු යන්ත්‍රය මෙම සභාවේ තාක්ෂණ නිලධාරිගේ නිර්දේශය හා අවශ්‍ය අනෙකුත් ආයතනවල තාක්ෂණික උපදෙස් ලබාගෙන මිළ දී ගැනිමටත් ගෙවීම් කිරීමටත් යෝජනා කරමි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා**</u>

**එම යෝජනාව ස්ථිර කරමි.මිල ගනන් 5ක් ලැබිලා.ටැක්ටරයට සවි කරන එකට විරුද්ධයි.**

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**</u>

**කටාන ප්‍රාදේශිය සභාවේ පිට්ටනි 18 ක්.ටැක්ටරයට සවිකරලා කපන්නේ.මෙතන මිල ගනන් අනුව ලක්ෂ 4 එකට ලෑන්ඩ් මාස්ටර් සවි කරන එකක්.ලෑන්ඩ් මාස්ටර් එකත් ගනන්.කීයද බලලා තාක්ෂණය බලා ගමු.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා**</u>

ලෑන්ඩ් මාස්ටර් එක්ක තියෙන එකත් තියෙනවා.දන්න පුද්ගලයෙක් ඉන්නවා. ඒ පුද්ගලයා ඇවිත් කපලා දීලා බ්ලේඩ් එකකුත් දෙනවා කීවා.රෙපෙයාර් කරනවා කීවා.ඉන්ජිනේරුවරයෙක්හෝ දන්න අයෙක් මගින් නිර්දේශ ගත හැකියි.ලක්ෂ 8 1/2 දැන්නම් වැඩි ඇති.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ.විජේසිරි මහතා**</u>

කුබෝටා ජපන් තාක්ෂනය ඉහල එකත් තියෙනවා.

<u>**ගරු ප්‍රාදේශීය සභාඋප සභාපති අනිල් ලියනගේ මහතා :-**</u>

විශාල වියදමක් වැය කරලා හැදුවේ පිටිය. ඒක නිසි පරිදි නඩත්තු කලහැකි තත්වයේ සුදුසු එකක් ගන්න.කිරිඇල්ල ක්‍රිඩා පිටියටත් තණකොල කැපිමට සුදුසු යන්ත්‍රයක් හැකි ලෙස ලබාදිම සුදුසුයි.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා**</u>

අළුත්වැඩියා කිරිමට විශාල වියදමක් දරන්න සිදු නොවන පරිදි කටයුතු කරන්න. නැත්නම් මෙම යන්ත්‍රයටත් මාසිකව විශාල වියදමක් නඩත්තුවට යයි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා මහජන ක්‍රීඩාංගනය සඳහා තණකොළකැපීමේ යන්ත්‍රයක් මිලදීගැනීම සඳහා වන මිල ගණන් අනුව** ඒ ඒ ආයතන විසින් නිෂ්පාදනය කරනු වර්ග කීපයකින් යුත් යන්ත්‍ර සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති බැවින් එනම් **JNB Auto Traders,** හා **M&L Agro Machinery** යන ආයතන දෙක විසින් tafe/240-tractor/135-tractor /sonlika/Jhon Deer/New Holand/Mahendra/Standard යන මහ ට්‍රැක්ටර් රථයකට සම්බන්ධ කර තණ කොළ කැපීමේ **slasher** 01ක් සඳහා මිළ ගණන් ඉදිරිපත් කර ඇති අතර අනෙක් ආයතන විසින් අත් ට්‍රැක්ටර්යකට **slasher** 01ක් සම්බන්ධ කර සකස් කරනු ලබන අත්ට්‍රැක්ටරය

සමඟ තණ කොළ කැපීමේ යන්ත්‍රයකට මිළ ගණන් ඉදිරිපත් කර ඇති බැවින් ඒ ඒ යන්ත්‍රවල පිරිවිතරයන්ද එකිනෙකට වෙනස් වන අතර එබැවින් මෙම මිළ ගණන් පත් අතුරින් මෙම සභා ක්‍රීඩාංගනයට සුදුසු යන්ත්‍රය මෙම සභාවේ තාක්ෂණ නිලධාරිගේ නිර්දේශය හා අවශ්‍ය අනෙකුත් ආයතනවල තාක්ෂණික උපදෙස් ලබාගෙන මිළ දී ගැනිමටත් ගෙවීම් කිරීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**05-26. 28885/ඉඩම් නඩුවේ නීතිඥ ගාස්තු වැඩිකිරීමේ ඉල්ලිම සම්බන්ධයෙන් මහා සභා තීරනයක් ලබා ගැනීමේ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**28885/ඉඩම් නඩුව (පුහුවල කනත්ත වත්ත) සම්බන්ධ නඩුව සඳහා නීතිඥ ගාස්තු රු.45000.00 දක්වා වැඩිකර ලබා දෙන ලෙස ඉල්ලිමක් නීතිඥ ධනංජය අබේවර්ධන මහතා සහ නීතිඥ නන්දපාල වික්‍රමසූරිය මහතා විසින් ඉදිරිපත්කර ඇත. සම්බන්ධයෙන් මහා සභා තීරනයක් ලබා ගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභාඋප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

**යෝජනාව ස්ථිරයි.මෙම ගාස්තුව වැඩියි. මේ අවස්ථාවේ සභාවට දැරීමට අමාරුයි.වෙන අයෙක් ගමු.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**අංක 28885/ඉඩම් නඩුව (පුහුවල කනත්ත වත්ත ) නඩුව සඳහා නීතිඥ ගාස්තු රු.45000.00 ක් ලෙස වැඩිකිරිම සම්බන්ධ ඉල්ලිමට සභා අනුමැතිය ලබා නොදීමට කටයුතු කරමු.**

<u>ගරු ප්‍රාදේශීය සභාඋප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

**එසේ කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව අනුව අංක 28885/ඉඩම් නඩුව (පුහුවල කනත්ත වත්ත ) නඩුව සඳහා නීතිඥ ගාස්තු රු.45000.00 ක් ලෙස වැඩිකිරිම සම්බන්ධ ඉල්ලිමට මහා සභා අනුමැතිය ලබා නොදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**2022.09.09 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05- 27 යටතේ ගනු ලැබූ තීරනය**

**05-27.** ගරු මන්ත්‍රීතුමන්ලා විසින් 2022 වර්ෂය තුල යෝජනා කොට හා ගිවිසුම්ගතව තිබූ කර්මාන්ත ,එම ඇස්තමේන්තු මුදල තුල වර්තමානයේ ක්‍රියාත්මක කල නොහැකි බැවින්, එම ඇස්තමේන්තු මුදල අද පවතින මිල ගනන් අනුව සංශෝධනය කර ක්‍රියාත්මක කිරිමට මහා සභා අනුමැතියක් ලබා ගැනීමේ යෝජනාව

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

**මෙම යෝජනාවට සංශෝධනයක් ඉදිරිපත් කරන අතර 2022 වර්ෂය නොව 2021 වර්ෂය තුල ලෙස** සංශෝධනය කිරීමටත් ඒ අනුව 2021 **වර්ෂය තුල** යෝජනා කොට හා ගිවිසුම්ගතව තිබූ කර්මාන්ත ,එම ඇස්තමේන්තු මුදල තුල වර්තමානයේ ක්‍රියාත්මක කල නොහැකි බැවින්, එම

ඇස්තමේන්තු මුදල අද පවතින මිල ගනන් අනුව සංශෝධනය කර පහතඅංක 5-27-1 සිට5-27-12 දක්වා ඇති කර්මාන්ත ක්‍රියාත්මක කිරිමට හා ගෙවීම් කිරිමටත් යෝජනා කරමි.

5-27-1.නාමල්දෙනිය ගිමන්හල අසල කාණුව තැනීම. -රු.1442432.71
5-27-2 එල්ලාවල උපකාර්යාලයේ කාර්යාල කොටස ටයිල් අතුරා අළුත්වැඩියා කිරිම
5-27-3 .කරපිංච පාතගම පළාත් මාර්ගයේ සිට කැන්දලන්ද මාර්ගය කොන්ක්‍රිට් කිරිම
5-27-4.මාටුවාගල ක්‍රිඩා පිටිය අසල කාණුව සැකසිම
5-27-5.පාතගම දුම්මලේ ගොඩ මංජුල මහතාගේ නිවස අසල සිට උපාලි මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රිට් කිරිම
5-27-6.දෙමංහන්දිය අජිත් මහතාගේ නිවසඅසල මාර්ගය කොන්ක්‍රිට් කිරිම
5-27-7.වැළිහිඳ ලක්සිරි මහතාගේ නිවසඅසල මාර්ගය කොන්ක්‍රිට් කිරිම
5-27-8.වැළිහිඳ ප්‍රෙමසිරි මහතාගේ නිවසඅසල මාර්ගය කොන්ක්‍රිට් කිරිම
5-27-9.මහවත්ත කන්ද ගලහේන මාර්ගය කොන්ක්‍රිට් කිරිම
5-27-10.මහවත්ත කන්ද නිමල් මහතාගේ නිවසඅසල මාර්ගය කොන්ක්‍රිට් කිරිම
5-27-11.කුරුගංමෝදර සිට අධිකාරිය පන්සල දෙසට මාර්ගය දුෂ්කර ස්ථාන කොන්ක්‍රිට් කිරිම
5-27-12.කිරිවැල්දෙනිය එම්.කේ.තිලකරත්න මහතාගේ නිවසදෙසට මාර්ගය කොන්ක්‍රිට් කිරිම

5-27-13.පිටකන්ද අතුරු පාර කොන්ක්‍රිට් කිරිම

<u>ගරු ප්‍රාදේශීය සභාඋප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**
<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

නාමල්දෙනිය ගිමන්හල අසල කාණුව තැනීම අත්‍යවශය කරුනක්.මේ ගිමන්හල දිගු කාලයක් වැසි තිබුනා.පසුව බදුගත් අයෙක්ද සිටියා.ඒ අතර මාර්ගසංවර්ධන අධිකාරියේ හා අපේ ගොඩනැගිල්ල අතර කාණුව තිබූ නිසා මාර්ගය අවහිර වුනා.වාහනවලට ගිමන්හලට යන්න බැරි

තත්වයක් ඇති උනා. ඒ අතර මේ කාණුව කපලා දිගුකලක් තිබුනා.රටේ ආර්ථික පසුබිම , මිල ගනන් එක්ක ගිවිසුම් ගත මුදලට කරන්නබැරි තත්වයක් උනා.ඒ උනත් ප්‍රෙද්ශයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු,ජනතාව මේ කාණුව කඩිනමින් සැකසීම කල යුත බවට මාහට වරින් වර ඉල්ලීම්කලා.ඒ නිසා මේ දැඩි අවශ්‍යතාවය මත ඇස්තමේන්තු සංශෝදනය කරලා කර්මාන්තය නිම කරන්න අවශ්‍යයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා :-

**ගිය වසරේ ලක්ෂ 10ට කරන්න බැරි උන කර්මාන්තය .ඒ.බී.සී. ත් දාලා. සභාවෙන් ලිපියක් ආවා වැඩ නවත්වන්න කියලා.ඒක කලහැකිද?**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**ඇස්තමේන්තු සංශෝධනය කර කල හැකියි.මුදල් ලැබුනාම ගෙවන්නේ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-

**රීති ප්‍රශ්නයක්.මේ යෝජනා ඉදිරිපත් කිරීමේදි සමහර යෝජනා පුද්ගලික ව සීමා වන යෝජනා වගේ.ඒවා යම් පුද්ගලයන්ට වාසි ඒවා විය හැකියි.ඉල්ලීම්. පක්ෂ ග්‍රාහි වගේ.ඒවා පුද්ගලිකව වාසි ඒවා වෙන්න පුළුවන්.බදු මුදල් කපා හැරීම්,පාරවල් ගැන,පොදු නැති ඒවා.මේවා තීන්දු දුන්නාම අවැඩක් වෙන්නත් පුළුවන්.මේ ඉල්ලීම් කමිටුවට දාලා එන්න ඕනි කමිටුවෙන්. පනත අනුවත් චක්‍රෙල්බ අනුවත් බැරි ඒවා බැරි බව කියන්න. දැනුම් දෙන්න කල නොහැකි බව. මේ ඇතැම්වා අධිභාරත් විය හැකියි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව අනුව 2021 වර්ෂය තුල යෝජනා කොට හා ගිවිසුම්ගතව තිබූ කර්මාන්ත ,එම ඇස්තමේන්තු මුදල තුල වර්තමානයේ ක්‍රියාත්මක කල නොහැකි බැවින්, එම ඇස්තමේන්තු මුදල අද පවතින මිල ගනන් අනුව සංශෝධනය කර න ලද ඉහත නම් සඳහන්අංක 5-27-1 සිට5-27-12 දක්වා ඇති කර්මාන්ත ක්‍රියාත්මක කිරිමට හා ගෙවීම් කිරීමට මහා සභා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

**2022.09.09 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 05-27 යටතේ ගනු ලැබූ තීරනයේ සත්‍ය උදෘතයක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**05-28.** තලාවිටිය සුසාන භූමියේ පිහිටි අනතුරුදායක කොස්ගස් කපා ඉවත් කිරීම සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් තලාවිටිය සුසාන භූමියේ පිහිටි කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයට හා විදුලි රැහැන් වලට අනතුරු දායකව පිහිටා ඇති පහත විස්තර සඳහන් කොස්ගස් තුන කපා ඉවත් කිරීමට නීත්‍යානුකූල ක්‍රමවේදය අනුව මිල ගනන් කැඳවා කටයුතු කිරීමට යෝජනා කරමි.

ගිය සභාවේත් මෙසේ අනතුරු ගස් 10 ක් කපා ඉවත් කිරිමට මිල ගනන් කැඳවීමට කටයුතු කලා. ඒ සමගම මේ ගස් පිලිබඳවද කටයුතු කල හැකියි.

ගස් විස්තරය

1.කොස් ව.අඩි 4.8 ප්‍රධාන මාර්ගයට හා විදුලි රැහැන් වලට දුර අඩි 35.0 උස අඩි 70 පමන

2. කොස් ව.අඩි 4.2 ප්‍රධාන මාර්ගයට හා විදුලි රැහැන් වලට දුර අඩි 35.0 උස අඩි 70 පමන

3. කොස් ව.අඩි 5.2 ප්‍රධාන මාර්ගයට හා විදුලි රැහැන් වලට දුර අඩි 35.0 උස අඩි 70 පමන

ගරු ප්‍රාදේශීය සභාඋප සභාපති අනිල් ලියනගේ මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි. තලාවිටිය අමුහේන්කන්ද ශෛලමතී විහාරස්ථානයේ සංවර්ධන කටයුත්තකට දැව අවශ්‍යයි. ඉල්ලීමක් තියෙනවා.වැදගත් පූජනිය ස්ථානයක්.යම් තක්සේරු මුදලකට ප්‍රමානයක් ලබාදෙන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

අවශ්‍ය ගහක් තක්සේරු මුදලට ලබා දෙමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා :-

ගස් කපන විට අළුතෙන් ගස් හිටවන ක්‍රමවේදයකුත් ක්‍රියාත්මක කරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවට අයත් තලාවිටිය සුසාන භූමියේ පිහිටි කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයට හා විදුලි රැහැන් වලට අනතුරු දායකව පිහිටා ඇති ඉහත විස්තර සඳහන් කොස්ගස් තුන කපා ඉවත් කිරීමට නීත්‍යානුකූල ක්‍රමවේදය අනුව මිල ගනන් කැඳවා කටයුතු කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx

**05-29** ඇස්තමේන්තු

**05-29-01**-තිප්පලහේන පරකඩුව ආරණ්‍යපාර පැතිබැම්ම ඉදිකිරිම- රු.500958.82

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

තිප්පලහේන පරකඩුව ආරණ්‍යපාර පැතිබැම්ම ඉදිකිරිම- රු.500958.82 ඇස්තමේන්තු සඳහා මහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතා :-

**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව අනුව තිප්පලහේන පරකඩුව ආරණ්‍යපාර පැතිබැම්ම ඉදිකිරීම( රු.500958.82 )ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**05-30.පළාත් පාලන ආයතන සීමාවේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස්කිරීම සඳහා බහාලුම් ස්ථාපනය සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**සහකාර පළාත් පාලන කොමසාරිස්, රත්නපුර විසින් මෙම සභාව යොමුකර ඇති 2022.08.31 දිනැති ලිපිය අනුව පරිසර අමාත්‍ය ලේකම් අනිල් ජාසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් 2022.07.05 දින පැවැත්වූ ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස්කිරීම සම්බන්ධ සාකච්ඡාවේදි සිලෝන් එමරල්ඩ් වේ ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් ඉදිරිපත්කල ව්‍යාපෘතිය කෙරේ අවධානය යොමුකරන ලදි.ඒ අනුව රත්නපුර දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන සිමාව තුල ප්ලාස්ටික් අපද්‍රවය එක්රැස්කිරීමේ බහාලුම් ස්ථානගත කිරිමටත් එක්රැස්වන ප්ලාස්ටික් අපද්‍රවය සෘජුවම එම ආයතනය වෙත උපරිම මුදලට ලබාගැනිමටත් හැකිබව දක්වා ඇත.**
**ඒ අනුව මෙම ප්‍රාෙද්ශිය සභාසීමාවේද ඉහත පරිදි ප්ලාස්ටික් අපද්‍රවය එක්රැස්කිරීමේ බහාලුම් ස්ථානගත කිරිම ට එකඟවන්නේ නම් ඒ සඳහා එකගත්වය හා ස්ථානගත කිරිම ට අවශ්‍ය ස්ථානද පිලිබඳ දැනුවත් කරන ලෙස දන්වා ඇත.**

**ඒ අනුව කුරුවිට ප්‍රාදේශීය සභා සීමාව තුල_ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස්කිරීමේ බහාලුම් පහත පරිදි ස්ථාන වල ස්ථානගත කිරිම ට අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.**

කුරුවිට ප්‍රාදේශිය ලේකම් කොටඨාශය

| ස්ථානය | ප්‍රමාණය |
|---|---|
| • ප්‍රාදේශිය සභා භූමිය | 01 |
| • නගර මධ්‍යයේ | 02 |
| • ප්‍රාදේශිය ලේකම් කාර්යාලය | 01 |
| • බෝපත් ඇල්ල රථගාල පරිශ්‍රයේ හන්දිය | 01 |
| • සී/ස හයිඩ්‍රාමණී ආයතනය ඉදිරිපිට/ඇතුලත | 02 |

| | |
|---|---|
| • නන්ද එල්ලාවල කර්මාන්ත පුරය තුළ | 01 |
| • වෛද්‍ය පීඨය- හිදැල්ලන(බටුහේන) | 01 |
| • පැරඩයිස් හන්දිය | 01 |
| • බටුහේන පාසල අසල | 01 |
| • මලංගම කඩ පේලිය අසල | 01 |
| • හිග්ගස්හේන හන්දිය | 01 |
| • කඳන්ගොඩ හන්දිය | 01 |
| • මිල්ලවිටිය හන්දිය | 01 |
| • සෙරමික් හන්දිය | 01 |
| • කරපිංච බස් නැවතුම්පල | 01 |
| • කරපිංච බස් නැවතුම්පල | 01 |

| | |
|---|---|
| • එරත්න | 01 |
| • කොලනිය හන්දිය | 01 |
| • දෙව්පහල නගරය | 01 |
| • සැවෝන් හෝටලය | 01 |
| • සූදාගල පන්සල | 01 |
| • කිරගල ඩිස්පැන්සරිය | 01 |

**<u>කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් කොටඨාශය</u>**

| ස්ථානය | ප්‍රමාණය |
|---|---|
| • ලංකා බැංකුව ඉදිරිපිට | 01 |
| • හැරනියාවක හංදිය | 01 |
| • පොදු වෙළඳපල | 01 |
| • බස්නැවතුම්පල | 01 |
| • ඇල්ලෙ දේවාලෙගාව | 01 |
| • මඩල හංදිය | 01 |
| • මාටුවාගල හන්දිය. | 01 |

**<u>ගරු ප්‍රාදේශීය සභාඋප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>**

**එම යෝජනාව ස්ථිර කරමි**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා විසින් ඉදිරිපත් කරන යෝජනාව අනුව සිලෝන් එමරල්ඩ් වේ ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් ඉදිරිපත්කල ව්‍යාපෘතියමගින් කුරුවිට ප්‍රාදේශීය සභා සීමාව තුල ප්ලාස්ටික් අපද්‍රව්‍ය එක්රැස්කිරීමේ බහාලුම් ඉහත පරිදි ස්ථාන වල ස්ථානගත කිරිම ට අනුමැතිය ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

## 06.කාරක සභාවල වාර්තා

### කාරක සභාවල වාර්තා

06-01 මුදල් කමිටු වාර්තාව(2022.09.06 )

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

22.09.06 දින මුදල් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ.එම්.එස්.එස්. ධනවර්ධන මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-**

මුදල් කමිටුවට ගතවි ඇති කාලය පැය 1 1/2ක් පමණයි.නිලධාරින් අවමයි.කාර්මික නිලධාරිවත් නෑ.එසේම එකමපක්ෂෙ මන්ත්‍රිවරු විතරයි.මේ ක්‍රමවේදය හරි නෑ. වෙනත් ක්‍රමවේදයක් යොදාගන්න.වාහන දැනුම ඇති අයෙකුත් ඕනි. මේ මාසෙට ඩීසල් 14 වතාවක් ගහලා.එක එක තැන්වලින් ගහලා.මේවා පිලිබද නිසි අධික්ෂන තියේද?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

කාර්මික නිලධාරි අනුමැතිය ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා :-**

අංක 6456 ටැක්ටර් රථය වියදම් අඩුයි.හොඳ රියදුරු වරයෙක් ඉන්නේ.මේ වාහන ගැන අධීක්ෂනය මදි.පාලනයක් නෑ.විශාල මුදලක් වැයවෙනවා වාහන වලටයි නඩු වලටයි.මේ වරිපනම් හිඟ තියෙන ඒවාට නඩු දෙකක් දාල හිඟ අයකරගත්තොත් අපිට පුළුවන් ඉතිරි ඒවත් නිසි ලෙස ලබාගන්න.එසේම අංක 122 හි විෂය නිලධාරීගේ 2022.08.12 දිනැති ලිපිය ලෙස සඳහන්ව ඇති දිනය හා එම කරුන නොසැසදේ.එසේම අංක 145 හි 6949 ටැක්ටර් රථය 22.08.24 දින අනතුරට පත්වුබව සදහන් . මේ දිනයන් සාවද්‍යායි. මම මේ වාර්තාවට විරෝදතාවය පල කරනවා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

අංක 122 හි විෂය නිලධාරීගේ 2022.08.12 දිනැති ලිපියලෙස සඳහන් වීම වැරදියි. එය 2022.08.31 දින ලෙස සඳහන් විය යුතු අතර අංක 145 හි 6949 ටැක්ටර් රථය 22.08.24 දින අනතුරට පත්වුබව සඳහන් වුවත් එයද 21.08.24 දින අනතුරට පත්වු ටැක්ටර් රථය ලෙස නිවැරදි විය යුතුයි.මෙම දිනයන් නිවැරදි කරන්න.සංශෝධනය කරන්න.එසේම අංක 126 හි බොබ්කැට් යන්ත්‍රය සේවා කටයුතු වෙනුවෙන් ගෙවීම් කිරීම  මුදල් කමිටු තීරනයේ සඳහන් වනුයේරු.167701.00 වන අතර  නමුත් වැට් එකතු කල නිවැරදි අගය වනුයේ 187825.12 කි.(රු.167701.00 +වැට් 20124.12 )මෙයද සංශෝධනය විය යුතුය.එසේම අංක 141 හි 28035/L නඩුවේ නිතිඥ ගාමිණී රත්නායක මහතාව සේවයේ යොදවාගනුයේ නීතීඥ සුමේධ රත්නායක මහතාගේ උපදේශකත්වය මත කටයුතුකිරිමට බව සඳහන් විය යුතුය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ජී.එම්.ජයරත්න මහතා :-</u>

ඩිසල්  ඉන්ධන සඳහා ගෙවීම් කිරීමෙදි පැරණී ඒවා ගෙවිම් කරනවා.මේ පහුවෙලා ඉදිරිපත්කරන්නේ ඇයි?විනිවිද නෑ වගේ.එසේම අංක 140 හරිශ්චන්ද්‍ර හට ගෙවිම් කිරිම පැය 35ක් සේවය කිරීම වෙනුවෙන්. මේවාට විකල්ප ක්‍රම වේද හදන්න.

<u>ගරු ප්‍රාදේශීය සභාඋප සභාපති අනිල් ලියනගේ මහතා :-</u>

ඉන්ධන සම්බන්දව නිවැරදි කාල වකවානු සඳහන් කර  සියළු තොරතුරු නිවැරදිව කමිටුවට යොමු කරන්න. නිවැරදි කිරිම් කරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** 2022.05.09 වන දින මුදල් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව **සභා සම්මත කිරීමට  ත් ඒ අනුව** අංක 122 හි විෂය නිලධාරීගේ 2022.08.12 දිනැති ලිපියලෙස සඳහන් වීම වැරදි වන අතර එය 2022.08.31 දිනැති ලිපිය ලෙස නිවැරදි කිරිමටත් අංක 145 හි 6949 ටැක්ටර් රථය 22.08.24 දින අනතුරට පත්වුබව සඳහන් වුවත් එයද 21.08.24 දින අනතුරට පත්වු ටැක්ටර් රථය ලෙස නිවැරදි කිරිමටත් අංක 126 හි බොබ්කැට් යන්ත්‍රය සේවා කටයුතු වෙනුවෙන් ගෙවිම් කිරීම  මුදල් කමිටු තීරනයේ සඳහන් වනුයේ රු.167701.00 වන අතර  නමුත් වැට් එකතු කල නිවැරදි අගය වනුයේ 187825.12 ක් (රු.167701.00 +වැට් 20124.12 ) වන හෙයින් එම මුදල 187825.12 ලෙස හා අංක 141 හි 28035/L නඩුවේ නිතිඥ ගාමිණී රත්නායක මහතාව සේවයේ යොදවාගනුයේ නීතීඥ සුමේධ රත්නායක මහතාගේ උපදේශකත්වය මත කටයුතුකිරිමට බව සඳහන් විය යුතු අතර මෙම සංශෝදනයන් සිදු  කිරීමටත් **අනෙකුත් සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවටත්  ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-02 කාර්මික කමිටු වාර්තාව (2022.08.18)

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

2022.08.18 දිනැති කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත් **මහා** සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ.එම්.එස්.එස්. ධනවර්ධන මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

**Xxxxxxxxxxxxxxx** කාර්මික කමිටු වාර්තාව (2022.08.18) **සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

06-03 කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායක කමිටු රැස්වීම් වාර්තා.(2022.07.05 ,22. 08.05)

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මහා සභාවේ දැනුවත්විම සඳහා ඉදිරිපත් කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි මිය :-

**වාර්තාවේ අංක 5 සම්බන්ධව.මා විසින් 2021.05.17 දිනැතිව මහා සභාවට කල යෝජනාව අනුව තීරන අංක 05-12 යටතේ ඇති තීරනය අනුව 2022.02.08 දින ස්ථාන පරීක්ෂනයක් කලා.මේ ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සබාවට අයත් එකක්.ඉදිරි නඩු කටයුතු සඳහා බාධාකාරි විය හැකි ලෙස කුරුවිට කුඩා නගර ජල ව්‍යාපෘතියෙන් ජලය ලබාගෙන.මේ ඉඩම මගේ නොවේ. මෙය මෙය උපාලි රතුගම මහතාගේ.ඒ ඉඩම මා විසින් බලා ගත්තා.ඉඩමේ සියළු ප්ලෑන්,ලියවිලි තියෙනවා.උපාලි රතුගම මහතාගේ නමින් තියෙනවා. එදා පරීක්ෂනයේදි ඒ අයිතිය තහවුරුඋනා.ආරවුලක් බවත් ඔප්පුඋනා.නඩු දාන්න ලියවිලි හදලා තියෙන්නේ.ඒ පුද්ගලයා පදිංචි අල්ලපු ඉඩමේ.බාගෙට හදපු ගෙට බඩු ටික දාලා පදිංචිවෙලා.දරුවෝ තුන්දෙනෙක්.මෙහේ ගිට අයටත් කියලා.මට හිමිකමක් නෑ.උපාලි රතුගම මහත්තයටයි තියෙන්නේ.විදුලිය අරන් ඒත් වංචනිකව.පදිංචි ඉඩම අල්ලපු එක.ඒ ජල සම්බන්ධතාවය ඒකට දෙන්න.මේක සමාජයට දෙන වැරදි අවබෝධයක්.නඩු දාන්න බෑ මෙ ජලයත් දිලා නිසා ගැටළුවක්.ඒ පරීක්ෂන වාර්තාව මම දැක්කේ නෑ.මට පෙන්නන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**විදුලි බිල ක් ඉදිරිපත්කරලා.ඒ අනුව ජලයත් දිලා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි මිය :-

**ඒ ඉඩම ඒ පුද්ගලයාගේ කියලා ඔප්පු උනාද?පදිංචි ඉඩමට ඒ ජල සම්බන්ධතාවය දෙන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**ඔබටත් අයිතියක් නෑ. ඒ නිසා ඒ ඉඩම හිමි රතුගම මහත්තයට ඉදිරිපත් වෙන්න කියන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනි මිය :-

**රතුගම මහත්තයට ඉදිරිපත්වෙන්න කියන්නම්.රතුගම සර්ගේ ලියවිලි මං ගාව තියෙනවා.ලිඛිතව ඊලඟ සභාවට ඉදිරිපත් කරන්නම්.**

**07 ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

07-01 2022 ජූලි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

2022 ජූලි මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රීණී ප්‍රේමා ගම්ලත් මිය-**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx2022 ජූලි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

07-01. 2022 අගෝස්තු මස ගෙවීම් වාර්තාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

මෙම ගෙවීම් වාර්තා අනු අංකය 07-02 ලෙස නිවැරදි විය යුතුය.2022 අගෝස්තු මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී ප්‍රේමා ගම්ලත් මිය :-

2022_අගෝස්තු මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා :

ගෙවීම් වාර්තාව කලින් දෙන්න. සභා වාර්තාව සමග යොමු කරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 2022 අගෝස්තු මස ගෙවීම් වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

## 08.වෙනත් කරුණු

### 08-01.කීරගල සුසාන භූමියේ කටයුතු සඳහා බැකෝයන්ත්‍රය ඉල්ලා සිටීම.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

**කීරගල එක්සත් අවමංගල්‍යාධාර සමිතිය මගින් පාලනය වන කීරගල බංගලා හන්දිය අසල පිහිටා ඇති සුසාන භූමියේ විශාල ගස් පිහිටා ඇති බවත් මෙම වල් ගස් ඉවත්කිරිමට සබාවේ බැකෝයන්ත්‍රය ලබාදෙන ලෙසත් එම සමිතියේ ගරු සභාපති විසින් ඉල්ලීම් කර ඇත.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**මෙම ඉඩම් සමතලා කරන්න බෑ. භූමදාන කල ඉඩම්.ඒ සම්බන්ධව අවධානය යොමු කරන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

**මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන නීත්‍යානුකූලව කටයුතු කරමු.**

### 08-02.සභා ආදාහනාගාරය අළුත්වැඩියා කිරිම.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජන් ප්‍රදීප් මහතා :

**ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාරය අළුත්වැඩියා කල යුතු අතර ජනතාවට ලබාදෙන සේවාවක් ලෙසද මෙය වැදගත් නිසා කඩිනමින් මෙම කටයුත්ත සිදු කරන්න.ජනතාව අපහසුතාවයට පත්වේ.**

### 08-03. බෝග වගාවට අවශ්‍ය පහසුකම් ලබාගැනීම.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

කුරුවිට ප්‍රාථමික සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ආයතන භාර වෛද්‍ය නිලධාරී මගින් මගින් ඉල්ලීමක් ඉදිරිපත් කරමින් එම ආයතන භූමියේ බෝග වගාවට අවශ්‍ය පහසුකම් ලබාදෙන ලෙස ඉල්ලා ඇත.බෝග, ශ්‍රමය, මුරකරුවෙකු ආදිය ඉල්ලා ඇත.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

සභාවේ එම දේවල් ලබාදිය නොහැකි නිසා මෙය වෙනත් සුදුසු ආයතනයට යොමු කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

ගොවිජන සේවා ආයතනයට කඩිනමින් යොමුකරන්න.

## 08-04. සූර්ය විදුලි පද්ධතිය මිල ගනන්.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

මෙම සභාවේ සුදුසු ගොඩනැගිලි වලට සූර්ය විදුලි පද්ධතියක් සවිකිරිමට මිල ගනන් කැඳවා ඇති අතර ලැබුණු මිල ගනන් සභාවට ඉදිරිපත් කර ඇත.මේ සම්බන්ධව ලබන 20 දින විශේෂ මහා සභාවේදි සාකච්ජාවට ගමු. ව්‍යාපාති වාර්තාව,කාර්මික නිලධාරි වාර්තා,අවශ්‍ය වෙනත් වාර්තා සමග එදිනට විශේෂ සභාවට යොමුකරන්න.

## 08-05 අනවසර දැව ප්‍රවාහනය

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

පාරක් හැදුවාම අනවසරයෙන් දර ඇද්දාම පාර කැඩුනනම් ඒකට නිසි නිතිමය පිලියම් යොදන්න.අයකල හැකියි. නිතිය හැල්ලුවට ලක්කරන්න එපා.එල්ලාවල පිටකන්ද මාර්ගය.මේ සම්බන්ධව ලිඛිතව දන්වා අවශ්‍ය පියවර කඩිනමින් ගන්න. මේ සම්බන්දව මා මෙම සභාවේ නිතර කීවා. නිසි පියවරගෙන ඒ සම්බන්ධව මටත් පිටපතක් දෙන්න.

## 08-06 එල්ලාවල දංලන්ද මාර්ගයේ වංගුව නිරවුල් කිරිම.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

මෙම වංගුව ඉතා අනතුරුදායකයි. මෙම වංගුව ජේන්නෑ.ඉංජිනේරු සේවා එකෙන් මාර්ගය අධීක්ෂනය කලේ.වහාම මෙම මාර්ගයේ වංගුවේ පවතින අනතුර ඉවත් කරන ලෙස පළාත් ඉංජිනේරු සේවා අධ්‍යක්ෂ (මාර්ග) වෙත දැනුම්දෙන්න.ජන දිවියට අනතුරු බැවින් කඩිනම් කරන්න.මෙම දැනුවත් කිරීමේ පිටපතක් මාවෙතද ලබා දෙන්න.

## 08-07

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

කුරුවිට නගර සංවර්ධන සැලැස්ම පදනම්කරගෙන තොරතුරු දීලා තියෙනවා.තවදුරටත් අවශ්‍ය සංශෝදන පිලිබඳ විස්තර ලබාදෙන්න.

## 09-හදිසි යෝජනා

9-01. <u>නිවාඩු අනුමත කිරීම</u>

<u>**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**</u>

**_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයසූරිය මහතා, _ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්. කේ. තිලකාවතී මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල්සිරි ජයලත් මහතා හදිසියේ_අසනීප වී ඇති අතර නිවාඩු ලබා දීමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.**

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx <u>**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**</u> <u>විසින් ඉදිරිපත් කරන ලද</u> හදිසි යෝජනා අනුව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් ජයසූරිය මහතා, _ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඩබ්. කේ. තිලකාවතී මිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල්සිරි ජයලත් මහතා හදිසියේ_අසනීප වී ඇති අතර නිවාඩු ලබා දීමට** ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

<u>**09-02 දොඩම්පෙ සීවලි වත්ත ඉඩමේ කොටසකට ඔප්පුවක් ලබාගැනීම.**</u>

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා**</u>

**දොඩම්පෙ සීවලි වත්ත හෙවත් කුරුගම්මෝදරවත්ත නමැති ඉඩමේ කොටසක් සඳහා ඔප්පුවක් ලබාදෙන ලෙස එම ඉඩමේ පදිංචි කාන්ති ගුණතිලක මිය විසින් මීට පෙර වාරකීපයක් ඉල්ලීම් කර ඇති අතර එය ලබාදීමට මහා සභා අනුමැතිය ලැබුනද මෙතෙක් කටයුත්ත සිදුනොවූ බැවින් දොඩම්පෙ සීවලි වත්ත හෙවත් කුරුගම්මෝදරවත්ත නමැති ඉඩමේ කොටසක් සඳහා ඔප්පුවක් ඉඩමේ පදිංචි කාන්ති ගුණතිලක මිය වෙත ලබාදීමේ කටයුත්ත කඩිනම් කරන ලෙස යෝජනා කරමි.හදිසියෝජනා යටතේ ඉදිරිපත් කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**

එම යෝජනාව ස්ථිර කරමි. මෙම කටයුත්ත විමසා බලා ඉටු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා**

**මේ කටයුත්ත ඉටුකරන්න. ගැටළුවක් නෑ.මාර්ග පහසුකම් නැති ඉඩමක්.භුක්ති විඳින අයට දෙන්නයි මේ ඉඩම් දීලා තියෙන්නේ.අනෙක් අයට ඔප්පු දීලා.මේකට ගන්න බැරිවෙලා.මේකේ වගකීම සම්පූර්නයෙන් මම ගන්නවා.පර්චස් 12,10 ඉඩම්.මේ වන විට ඔප්පු ගනනාවක් දීලා.ගැටළුවක් නෑ.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

**පෙර දීපු ඔප්පු බලමු.ඒ අනුව මේ ඔප්පුව නීත්‍යානුකූලව දෙමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා විසින් ඉදිරිපත් කරන ලද හදිසි යෝජනා ව අනුව **දොඩම්පෙ සීවලි වත්ත හෙවත් කුරුගම්මෝදරවත්ත නමැති ඉඩමේ කොටසක් සදහා ඔප්පුවක් එම ඉඩමේ පදිංචි කාන්ති ගුණතිලක මිය වෙත නීත්‍යානුකූලව ලබාදීමේ කටයුත්ත කඩිනම් කිරිමට** ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

- **ස්තූතිය.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

**ලබන 20 දින පෙ.ව.10.00 ට විශේෂ මහා සභාවට සියළු දෙනා සහභාගී වන්න. එසේම අදද දින සියළු සංග්‍රහ කටයුතු සිදු කල ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි දයා කස්තුරි මියට විශේෂ ස්තුතිය පිරිනමමි.** අද දින මහා සභාව සදහා සහභාගිවී සහය ලබාදුන් සියළු දෙනා හටද ස්තූතිය පල කරමි.

සභාවේ කටයුතු ප.ව. 2.55 ට ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී(දැ.ග.පි.)

**2023 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව සතු දේපළ හා වෙළඳ අයිතීන් බදු ලබා දීම.**

01.කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපළ හා වෙළඳ අයිතීන් 2023 වර්ෂයට අදාළව වාර්ෂිකව බදු පදනම මත ලබා දිය යුතු බව කාරුණිකව දන්වා සිටිමි.

ප්‍රාදේශීය සභාව සතු සතිපොළ

1. කුරුවිට සතිපොළ

ප්‍රදේශීය සභාව සතු මස් කඩ

1. වාණිජ සංකීර්ණ A හරක්මස් වෙළඳසැල
2. වාණිජ සංකීර්ණ A එළු හා කුකුළු මස් වෙළඳසැල
3. කිරිඇල්ල එළු මස් හා කුකුළු මස් වෙළඳසැල
4. කිරිඇල්ල එළ හරක් මස් වෙළඳසැල
5. කිරිඇල්ල මාළු වෙළඳසැල

ප්‍රාදේශීය සභාව සතු වාර්ෂික බදු පදනම මත ලබා දෙන අනෙකුත් දේපළ

1. ලංකා ධීවර සංස්ථාව මාළු අලෙවිහළ - වාර්ෂිකව 5% බැගින් වැඩිකර බදු ලබා දීම(2014.09.16/06-07-01 සභා තීරණය අනුව)
2. බෝපත් ඇල්ල නැරඹුම් ප්‍රවේශය
3. බෝපත් ඇල්ල රථගාල
4. කුරුවිට මහජන වැසිකිළිය

- ඉහත සඳහන් දේපළ 2022 වර්ෂයේ ටෙන්ඩර් ගතවු මුදල හා අයකළ ටෙන්ඩර් පෝරම ගාස්තුව, ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල පහත පරිදි වේ.

දේපළ නාමය 2022වර්ෂයේ ටෙන්ඩර් ගතවු මුදල ටෙන්ඩර් පෝරම ගාස්තු ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල

| දේපළ නාමය | 2022 වර්ෂයේ ටෙන්ඩර් ගත වූ මුදල | ටෙන්ඩර් පෝරම ගාස්තුව | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පතුව |
|---|---|---|---|
| වාණිජ A එළිහරක් මස් වෙළඳසැල | 790,000.00 | 1500.00 | 1500.00 |
| වාණිජ A එළු හා කුකුළු මස් වෙළඳසැල | 143,000.00 | 1500.00 | 1500.00 |
| කිරිඇල්ල එළ හරක් මස් වෙළඳසැල | 253,500.00 | 1500.00 | 1500.00 |
| කිරිඇල්ල එළු හා කුකුළු මස් වෙළඳසැල | 66,423.00 | 1500.00 | 1500.00 |
| කිරිඇල්ල මාළු වෙළඳසැල | 76,457.20 | 15000.00 | 1500.00 |
| කුරුවිට සතිපොළ | 523,500.00 | 15000.00 | 1500.00 |

| දේපළ නාමය | 2021 වාර්ෂික ආදායම අනුව | ටෙන්ඩර් පෝරම ගාස්තුව | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පතුව |
|---|---|---|---|
| බෝපත් ඇල්ල නැරඹුම් ප්‍රවේශය | 626,840.00 | | |
| බෝපත් ඇල්ල රථගාල | 242,750.00 | | |
| කුරුවිට මහජන වැසිකිළිය(දෛනික ගාස්තු අයකිරීමේ පදනම මත) | | | |

- 2023 වර්ෂය සඳහා සභාව සතු දේපළ හා වෙළඳ අයිතීන් බදු ලබා දීමේ දී වාණිජ A සංකීර්ණය නව ගොඩනැගිල්ලේ පිහිටි ලංකා ධීවර සංස්ථා මාළු අලෙවිහල 2014/09/16 06-07-01 සභා තීරණය අනුව 5% මුදලක් වැඩි කර බදු ලබා දී ඇති අතර බෝපත් ඇල්ල නැරඹුම් ප්‍රවේශය, බෝපත් ඇල්ල රථගාල හා කුරුවිට මහජන වැසිකිළිය යන ස්ථාන සඳහා මුදල් අය කිරීම 2021/9/10 මහා සභාවේ අංක 05-22 සභා තීරණය අනුව ප්‍රාදේශීය සභාව විසින් සිදු කර ඇත.

  - **ලංකා ධීවර සංස්ථා අලෙවිහල සඳහා 2014/9/16 06-07-01 සභා තීරණය අනුව බදු ලබා දෙන්නෙ නම් 2023 වර්ෂය සඳහා රු. 418913.92 ක මුදලක් අයකල යුතු බව දන්වා සිටිමි.**

- 2022 වර්ෂය සඳහා කුරුවිට සතිපොළ ස්ථිර කඩකාමරයකින් දිනකට අය කල හැකි උපරිම ගාස්තුව රු. 150 .00ක් බව කාරුණිකව දන්වා සිටිමි.(2021/09/10 මහ සභාවේ අංක 05-22 සභා තීරණය අනුව)

02. **(i)** .කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් නාමල්දෙණි සංචාරක ගිමන්හල සඳහා 2021/02/12 මහා සභාවේ තීරණ අංක 05-46 සභා තීරණය අනුව මාසිකව රු.25200/= මුදලක් ගෙවීමට එකඟව ගිවිසුම්ගත වුවත් මෙතෙක් එම ගිමන්හලේ සේවාවන් ආරම්භ කර නොමැති බව වාර්ථාවේ.මෙම ගිමන්හල ආදායම් උත්පාදනයකින් තොරව වසා තැබීම නිසා නැවත ටෙන්ඩර් මඟින් බදු ලබා දීම සුදුසු බව පෙන්වා දෙමි.මෙම ගිමන් හල 2023 වර්ෂයට අදාලව ටෙන්ඩර් කිරිමට කටයුතු කරන්නේ නම් අය කලයුතු අවම ලන්සු මුදල හා ගිමන්හල බදු ලබා දෙන කාල සීමාව මෙන්ම ටෙන්ඩර් පෝරම ගාස්තුව,ටෙන්ඩර් ඇප තැන්පත් මුදල තක්සේරු කල යුතු බව කාරුණිකව පෙන්වා දෙමි.

- කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් Type-01වෙළඳ සංකීරණයේ උඩු මහල අංක 06 හා බිම් මහල අංක11 යන කඩ කාමර සඳහා ටෙන්ඩර් ඉදිරිපත්කල නමුත් මෙතෙන් අදාල බදුකරුවන් ඉදිරිපත් වීනොමැත.එහි කඩ කාමර 02 සම්බන්ධව ඉදිරිකටයුතු පිළිබඳව ඔබගේ කාරුණික උපදෙස් පතමි.අදාල කඩ කාමර සඳහා අයකළ යුතු තක්සේරු මුදල හා ටෙන්ඩර් ඇප තැම්පත් මුදල හා ටෙන්ඩර් පෝරම ගාස්තු මුදල පහත පරිදි වේ.

| කඩ කාමර අංක | අවම ලංසු මුදල (රු.) | ටෙන්ඩර් පෝරම ගාස්තු මුදල (රු.) | ටෙන්ඩර් ඇප තැන්පතු මුදල (රු.) |
|---|---|---|---|
| Type-01වෙළඳ සංකීරණයේ උඩු මහල අංක 06 | 626,400.00 | 2,500.00 | 2,500.00 |
| Type-01වෙළඳ සංකීරණයේ බිම් මහල අංක11 | 954,000.00 | 2,500.00 | 2,500.00 |

- ඉහත සඳහන් දේපළ බදු ලබා දීමේ දී පළාත් පාලන කොමසාරිස්තුමාගේ අංක 03/2020 චක්‍ර ලේඛණය පිළිබඳව ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

- මෙකී දේපළ බදු ලබා දීමේදී ටෙන්ඩර් පත් විවෘත කිරීම සඳහා ටෙන්ඩර් කමිටුවක් පත්කල යුතු බැවින් එකී කමිටුවේ සාමාජිකයන් පිළිබඳ උපදෙස් පතමි.

- තවද ලංකා ධීවර සංස්ථා මාළු අලෙවිහල 2014/09/16 06-07-01 සභා තීරණය අනුව 5% මුදලක් වැඩි කර බදු ලබා දෙන්නේ ද යන්න හා බෝපත් ඇල්ල රථගාල ,බෝපත් ඇල්ල නැරඹුම් ප්‍රවේශය,කුරුවිට මහජන වැසිකිලියේ සේවාවන් 2023.වර්ෂය සඳහා බදු ලබා දෙන ආකාරය සම්බන්ධව ද, උක්ත දේපළ සඳහා අය කල යුතු අවම ලන්සු මුදල,ටෙන්ඩර් පෝරම ගාස්තුව,ටෙන්ඩර් ඇප තැන්පත් මුදල සම්බන්ධව ද ඉහත දේපළ බදු ලබා දීමේ පුවත්පත් දැන්වීම භාෂා තුනකින් පළ කලයුතු අතර එම දැන්වීම පළ කරනු ලබන පුවත්පත් සම්බන්ධව ද ඔබගේ කාරුණික උපදෙස් පතමි.

.....................
විෂය ලිපිකරු